

# අච්ඡරියබ්භූත සූත්‍රය

# අච්ඡරියබ්භූතසූත්‍රය.

**පදාර්ථ භාවාර්ථ අර්ථකථා සමෙතයි.**

ධර්මධරකෙණෙකුන්ලවා.

ලෙඛ කදොෂාපගමණය කරවාගෙණ.

**වැ ව ල**

**විලියම් රූපසිංහ අප්පුහාමි.**

වනමාවිසින්.

කොළඹ හුණුපිටියේ.

**ජිනාලඞ්කාර යන්ත්‍ර ශාලාවෙහි.**

අච්චුගස්වාප්‍රසිද්ධකරණලදී.

ශ්‍රී. බු. ව. 2441

ක්‍රි. ව. 1897.

විඥප්තිය.

---

## අච්ඡරියබ්භූත සූත්‍රය

මේසූත්‍රදේශනාව වනාහි අපමහබෝසතාණන් වහන්සේ දීපඞ්කරපාදමූලයෙහිපටන් බුදුබවපතා අවුත් වෙස්සන්තරරාජාමවන් ජාතියෙහි යාචකවූ ආ බමුණුහට දේවිය දන්දී ඊටප්‍රසන්නවූ ශක්‍ර දෙවේන්ද්‍රයාවිසින් දෙනලද වරඅට රැගෙණ දෙව්ලොව ඉපිදීමය— එයින්සැව මිනිස්ලොව මවුකුසපිළිසිඳීමය— මවුකුසින් බිහිවීමය— යනමේකාලයන්තුළ පැවති ආශ්චර්‍ය්‍යාද්භූතධර්මයන්හාදෙව්ලොව ඉපදීමදක්වා නොසිඳපැවති ආශ්චර්‍ය්‍යකථාවක් ප්‍රකාශිතකොට වදාරණලදින් මැදුම්සඟියෙහි අනාගිම්පණ්ණාසකයට අනාගීතකොට සඞ්ගායනාකරණලද සූත්‍රදේශනාවකි.

ඒ මේ සූත්‍රදේශනාවට කරතිබේන සන්නයද මීටවර්ණගුණ නාකට ප්‍රථම ධර්මවිනයාතිදක්ෂ යම්කිසි උගතෙක්විසින් අතර තුර හවාර්ථවර්ණනාකිරීමෙන් මොනවට සරසාතිබෙනනමුත් මෙහි කාතෘ අසවල්කලකවිසූ අසවලායයි නිශ්චය කළනොහැකිය.

එසේනමුත් සියල්ලන්විසින්හා විසෙසයෙන් බෞද්ධයන්විසි නුත් දැනගෙණ ගතයුතු බුදුන්කෙරෙහි අචලශ්‍රද්ධාව පිහිටුවාගැණීම ට හේතුභූත මනොඥනීය අදහස් ප්‍රකාශකොට අපිකථානුගත ක්‍රමයෙන් මෙය සකස්කරතිබෙනපරිදි සලකනවිට මෙසන්නකතෘ ධර්මයදත් අතිසමතෙක්මයයි නිශචිතයි.

එබැවින් සියලු බුද්ධභක්තිකයන්විසින් විසෙසයෙන් දැනග තයුතු ආවශ්‍යක ධර්මප්‍රකාශක මේසූත්‍රදේශනාව බොහෝදෙනාගේ ආ යාචනාවපෙරටුකොටලොකශාසනාභිවෘද්ධියත් ධර්මාවබොධයෙන්ශ්‍රද්ධා ප්‍රතිලාභයත් සලකා උඩපානදෙරටින් පොත්කීපයක් සපයා සංශො ධනයකොටබැලීමෙන් ඌණාතිරික්තසථානපූරණයෙන්හා ලෝකෝ පදේශානුගමණයෙන් ධර්මධරකෙණෙකුන්ලවා සකස් කරවාගෙණ අටු වාකථාවත් මීටයොදා මුද්‍රණයකරවාප්‍රසිද්ධකරන්ට කල්පනාකෙළෙමි.

ඉන්නිසා අපගේ මේශාසනාභිවෘද්ධිකාමීත්වයත් සද්ධර්මෝද්ග්‍රහණයෙන් අචලශ්‍රද්ධාවේපිහිටීමත් යනමේ උභයාර්ථය පරමාර්ථ කරගෙණ සියලුදෙනාවිසින් මින් එක එක පොත රැගෙණ ග්‍රහණ ධාරණයක්රීමෙන් දෙව්මිනිස්සැප සහ නිවන්සැපහසතප්‍රාප්තක රගැණීමට උත්සාහකටයුතු.

තවද මෙය නැවතමුද්‍රණයකිරීමෙහි බලය මෙහිපහතනාමජේ නමටමතබාගත්බවත් මෙයින් සියලුදෙනා වෙත දැනුම්දෙමි.

මේ වගට

**වැවල, විලියම් රූපසිංහ අප්පුහාමි.**

# ශුද්ධි පත්‍රය.

| පිට | පේළි. | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 ,, | 6 ,, 26 | සාලාය | සාලායං |
| ,, ,, | 24 | කාචපන | කාචපනවො |
| 2 ,, | 11 | තිහෙතං | තිහත්ථං |
| ,, ,, | 17 | උප්පජ්ජති | උප්පජ්ජි |
| ,, ,, | 20 | යමකි | යමපි |
| ,, ,, | 32 | ඔක්කුමති | ඔක්කමි |
| 4 ,, | 27 | හණේන | හණන්ත |
| ,, ,, | 30 | චත්තාරොච | චත්තාරො |
| ,, ,, | 32 | මහෙසක්ඛා | මහෙසක්ඛො |
| 5 ,, | 16 | අනුභිරමානෙ | අනුත්ථිරමානෙ |
| ,, ,, | 17 | ආසභං | ආසභිං |
| ,, ,, | 24 | අප්පමාණොච | අප්පමාණො |
| ,, ,, | 29 | අසඤ්ඤමසඤ්ඤං | අසඤ්ඤ[illegible]සඤ්ඤං |
| 6 ,, | 20 | බ්‍රහමණ | බ්‍රාහමණ |
| 7 ,, | 7 | නිස්සටත්තා | නිස්සටත්තාඅපගතත්තා |
| ,, ,, | 9 | තං | ත්ථං |
| ,, ,, | 11 | අච්ඡරිය | අච්ඡරියා |
| ,, ,, | 14 | පසීදිත්වා | පසීදිත්වාදිනෙන |
| ,, ,, | 21 | කිංපනස්ස | කිංපනසෙස |
| ,, ,, | 24 | සාරිකා | සාරිතා |
| ,, ,, | 29 | ආහරූපච්ඡෙදෙන | ආහාරූපච්ඡෙදෙන |
| 8 ,, | 1 | තිඨති | නතිඨති |
| ,, ,, | 23 | චන්දගහාහාදී | චන්දගහාහාදීනි |
| ,, ,, | 32 | හවිස්සමාති | හවිස්සාමාති |
| 13 ,, | 4 | චත්තාරොනං | චත්තාරො |
| 14 ,, | 7 | පචනතං | පචනත්තං |
| 15 ,, | 35 | මහෙසක්ඛා | මහෙසක්ඛො |
| 16 ,, | 25 | වත්තං | වුත්තං |
| ,, ,, | 31 | සුවණ්ණද්ධාදි | සුවණ්ණද්ධා |
| 17 ,, | 1 | මලාදීහි | මාලාදීහි |
| ,, ,, | 2 | කුතෙ | කුතො |
| ,, ,, | 4 | ඩා | හෙඩා |
| 25 ,, | 32 | එබැන් | එබැවින් |
| 35 ,, | 24 | නික්ඛමාති | නික්ඛමති |
| ,, ,, | 33 | ජතිරඞ්ග | ජාතිරඞ්ග |
| 36 ,, | 28 | විසිවින් | විසින් |
| 37 ,, | 16 | හලවිය | සහලවිය |
| 38 ,, | 12 | මුල්ලුලෙහි | මුලුල්ලෙහි |

# අච්ඡරියබ්භුත සුත්තං.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථි තෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අථඛො සම්බ ච්ඡාභත්තං පිඩපාතපටික්කන්තානං උපට්ඨානසාලාය සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරාකථා උදපාදි.

අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා යත්‍රහි නාම තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජානිස්සති එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං නාමා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං ගොත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං සීලා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං ධම්මා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං පඤ්ඤා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං විහාරී තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපී'ති

එවං වුත්තෙ ආයස්මා ආනන්දො තෙ භික්ඛූ එතදවොච, අච්ඡරියා චෙව ආවුසො තථාගතා අච්ඡරියධම්මසමන්නාගතා ච අබ්භුතා චෙව ආවුසො තථාගතා අබ්භුතධම්මසමන්නාගතා චා'ති, අයං ච තෙසං භික්ඛූනං අන්තරාකථා විප්පකතා හොති, අථ භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා කා ච පන අන්තරාකථා විප්පකතා'ති. ඉධ භන්තෙ අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං උපට්ඨානසාලාය සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරාකථා උදපාදි, අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා යත්‍රහිනාම තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ

වන්ත ජානිස්සති එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං
නාමා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවංගොත්තා තෙ භගව
න්තො අහෙසුං ඉතිපි එවංසීලා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එ
වං ධම්මා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවංපඤ්ඤා තෙ භගව
න්තො අහෙසුං ඉතිපි එවං විහාරී තෙ භගවන්තො අහෙසුං ඉතිපි
එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉති පී'ති ~ එවං වුත්තෙ භ
න්තෙ ආයස්මා ආනන්දො අම්හෙ එතදවොච, අච්ඡරියාචෙව ආවු
සො තථාගතා අච්ඡරියධම්මසමන්නාගතා ච අබ්භුතාචෙව ආවු
සො තථාගතා අබ්භුතධම්මසමන්නාගතා චා 'ති, අයං ඛො නො භ
න්තෙ අන්තරාකථා විප්පකතා අථ භගවා අනුප්පත්තො 'ති ~ අථ
ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි තස්මා, තිහෙතං ආනන්ද
භීයො සොමත්තාය පටිභන්තු තං තථාගතස්ස අච්ඡරියා අබ්භුතධ
ම්මා"ති

සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහී
තං සතො සම්පජානො උප්පජ්ජමානො ආනන්ද බොධිසත්තො තු
සිතං කායං උප්පජ්ජතී'ති යම්පි භන්තෙ සතො සම්පජානො බො
ධිසත්තො තුසිතං කායං උප්පජ්ජි ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡ
රියං අබ්භුතං ධම්මං ධාරෙමි ~ සම්මුඛා මෙතං භන්තෙ භගවතො
සුතං සම්මුඛා පටිග්ගහීතං සතො සම්පජානො ආනන්ද බොධිසත්තො
තුසිතෙ කායෙ අට්ඨාසී'ති යම්පි භන්තෙ සතො සම්පජානො බො
ධිසත්තො තුසිතෙ කායෙ අට්ඨාසි ඉදම්පහං භන්තෙ භගවතො අ
ච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි ~ සම්මුඛා මෙතං භන්තෙ භගව
තො සුතං සම්මුඛා පටිග්ගහීතං යාවතායුකං ආනන්ද බොධිසත්තො
තුසිතෙ කායෙ අට්ඨාසී'ති යම්පි භන්තෙ යාවතායුකං බොධිසත්තො
තුසිතෙ කායෙ අට්ඨාසි ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං
ධම්මං ධාරෙමි ~ සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටි
ග්ගහීතං සතො සම්පජානො ආනන්ද බොධිසත්තො තුසිතා කායා චවි
ත්වා මාතුකුච්ඡිං ඔක්කමී'ති යම්පි භන්තෙ සතො සම්පජානො බො
ධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමි ඉදම්පහං භ
න්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි ~ සම්මුඛා මෙතං
භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධි
සත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති අථ සදෙවකෙ
ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙ
වමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්ම
දෙවානං දෙවානුභාවං යා 'පි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධ

කාරා අන්ධකාරතිමිසා යත්ථ'පිමෙ චන්දිමසූරියා එවං මහිද්ධිකා එවං මහානුභාවා ආභාය නානුභොන්ති තත්ථ'පි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං යෙ'පි තත්ථ සත්තා උපපන්නා තෙ'පි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා'ති අයං ච දසසහස්සී ලොකධාතු සංකම්පති සම්පකම්පති සම්පවෙධති අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවන්ති යම්පි භන්තෙ—පෙ—ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි.— සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති චත්තාරො දෙවපුත්තා චතුද්දිසා රක්ඛාය උපගච්ඡන්ති මා නං බො බොධිසත්තං වා බොධිසත්තමාතරං වා මනුස්සො වා අමනුස්සො වා කොචි විහෙඨෙසී'ති යම්පි භන්තෙ—පෙ—ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි.— සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති පකතියා සීලවතී බොධිසත්තමාතා හොති විරතා පාණාතිපාතා විරතා අදින්නාදානා විරතා කාමෙසු මිච්ඡාචාරා විරතා මුසාවාදා විරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා'ති යම්පි භන්තෙ—පෙ—ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි.— සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං අනතික්කමණීයා ච බොධිසත්තමාතා හොති කෙනචි පුරිසෙන රත්තචිත්තෙනා'ති යම්පි භන්තෙ–පෙ–ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි.— සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති ලාභිනී බොධිසත්තමාතා හොති පඤ්චන්නං කාමගුණානං සා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙති'ති යම්පි භන්තෙ–පෙ–ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි.— සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති බොධිසත්තමාතු කොචිදෙව ආබාධො නුප්පජ්ජති සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා බොධිසත්තඤ්ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං සෙය්‍යථා'පි ආනන්ද මණිවෙළුරියො සුභො

ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය අයං ඛො මණිවෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා'ති එවමෙවඛො ආනන්ද යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති නබො බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා බොධිසත්තං ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියන්ති යම්පි භන්තෙ-පෙ-ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි~~~ සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං සත්තාහජාතෙ ආනන්ද බොධිසත්තෙ මාතා කාලං කරොති තුසිතං කායං උප්පජ්ජතී'ති යම්පි භන්තෙ—පෙ—ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි~~~සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යථාඛොපනානන්ද අඤ්ඤා ඉත්ථිකා නවවා දසවා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා විජායන්ති නහෙවං බොධිසත්තං බොධිසත්තමාතා දසෙවමාසානි බොධිසත්තං බොධිසත්තමාතා කුච්ඡිනා පරිහරිත්වා විජායතී 'ති යම්පි භන්තෙ-පෙ-ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි~~~සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති දෙවා පඨමං පතිගණ්හන්ති පච්ඡා මනුස්සා'ති යම්පි භන්තෙ—පෙ—ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි~~~සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යථාඛොපනානන්ද අඤ්ඤා ඉත්ථිකා නිසින්නාවා නිපන්නාවා විජායන්ති නහෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති ඨිතා ච ඛො බොධිසත්තං බොධිසත්තමාතා විජායතී 'ති යම්පි භන්තෙ—පෙ—ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි~~~සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති අප්පත්තොව බොධිසත්තො පඨවිං හොති චත්තාරො නං දෙවපුත්තා පටිග්ගහෙත්වා මාතු පුරතො ඨපෙන්ති අත්තමනා දෙවී හොහි මහෙසක්ඛො තෙ පුත්තො උප්පන්නො'ති යම්පි භන්තෙ-පෙ-ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි~~~සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති විසදෙව නික්ඛමති අමක්ඛිතො උදෙන අමක්ඛිතො සෙම්හෙන

අමක්ඛිතො රුහිරෙණ අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදො
සෙය්‍යථාපි ආනන්ද මණිරතනං කාසිකෙ වත්ථෙ නික්ඛිත්තං නෙව
මණිරතනං කාසිකං වත්ථං මක්ඛෙති නා'පි කාසිකං වත්ථං මණිරතනං
මක්ඛෙති තං කිස්සහෙතු උභින්නං සුද්ධත්තා එවමෙව ඛො ආනන්ද
යදා බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති විසදෙව නික්ඛමති
අමක්ඛිතො උදෙන අමක්ඛිතො සෙම්හෙන අමක්ඛිතො රුහිරෙණ
අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදො 'ති යම්පි භන්තෙ–පෙ–
ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි…
සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං යදා ආ
නන්ද බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති ද්වෙ උදකස්ස ධාරා
අන්තලික්ඛා පාතුභවන්ති එකා සීතස්ස එකා උණ්හස්ස යෙන බො
ධිසත්තස්ස උදකකිච්චං කරොන්ති මාතුචා'ති යම්පි භන්තෙ–පෙ–
ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි…ස
ම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං සම්පති
ජාතො ආනන්ද බොධිසත්තො සමෙහි පාදෙහි පතිට්ඨහිත්වා උත්තරා
භිමුඛො සත්තපදවීතිහාරෙන ගච්ඡති සෙතම්හි ඡත්තෙ අනුධී
රමානෙ සබ්බාච දිසා විලොකෙති ආසභිං වාචං භාසති "අග්ගොහ
මස්මි ලොකස්ස ජෙට්ඨොහමස්මි ලොකස්ස සෙට්ඨොහමස්මි ලොක
ස්ස අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවොති" යම්පි භන්තෙ
–පෙ–ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙ
මි…සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහීතං
යදා ආනන්ද බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති අථ සදෙවකෙ
ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව
මනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙ
ව දෙවානං දෙවානුභාවං යා'පි තා ලොකන්තරිකා අඝා අසංවුතා
අන්ධකාරා අන්ධකාරතිමිසා යත්ථ'පිමෙ චන්දිමසුරියා එවං මහිද්ධිකා එ
වං මහානුභාවා ආභාය නානුභොන්ති තත්ථ'පි අප්පමාණො උළා
රො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං යෙ'පි
තත්ථ සත්තා උප්පන්නා තෙ'පි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජා
නන්ති අඤ්ඤෙ'පි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා 'ති අයඤ්ච ද
සසහස්සී ලොකධාතු සංකම්පති සම්පකම්පති සම්පවෙධති අප්පමා
ණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවා
නං දෙවානුභාවන්ති යම්පි භන්තෙ–පෙ–ඉදම්පහං භන්තෙ භගව
තො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමි'ති–තස්මා තිහ ත්වං ආනන්ද
ඉදම්පි තථාගතස්ස අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙහි ඉධානන්ද
තථාගතස්ස විදිතා වෙදනා උප්පජ්ජන්ති විදිතා උපට්ඨහන්ති විදිතා

අබ්භත්ථං ගච්ඡන්ති විදිතා සඤ්ඤා විතක්කා උප්පජ්ජන්ති විදිතා උපට්ඨහන්ති විදිතා අබ්භත්ථං ගච්ඡන්ති–

ඉදම්පි ඛො ත්වං ආනන්ද තථාගතස්ස අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙහී'ති යම්පි භන්තෙ භගවතො විදිතා වෙදනා උප්පජ්ජන්ති විදිතා උපට්ඨහන්ති විදිතා අබ්භත්ථං ගච්ඡන්ති විදිතා සඤ්ඤා විතක්කා උප්පජ්ජන්ති විදිතා උපට්ඨහන්ති විදිතා අබ්භත්ථං ගච්ඡන්ති ඉදම්පහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතං ධම්මං ධාරෙමී'ති.

ඉදමවොච 'යස්මා ආනන්දො සමනුඤ්ඤො සත්ථා අහොසි, අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස භාසිතං අභිනන්දුන්ති.

අච්ඡරියබ්භුතසුත්තං නිට්ඨිතං.

# අච්ඡරියබ්භුතසුත්තස්ස කථා.

එවමෙමසුතන්ති අච්ඡරියධම්මසුත්තං–තත්ථ "යත්‍රහි නාමා"ති අච්ඡරියත්ථෙ නිපාතො, යො නාම සො තථාගතො'ති අත්ථො–"ජින්නපපඤ්චෙ"ති එත්ථ පපඤ්චා නාම තණ්හා මානො දිට්ඨී'ති ඉමෙ තයො කිලෙසා'ජින්නවටුමෙ'ති එත්ථ "වටුම"න්ති කුසලාකුසලකම්මවට්ටං වුච්චති "පරියාදින්නවට්ටෙ"ති තස්සෙව වෙවචනං "සබ්බදුක්ඛවීතිවත්තෙ"ති සබ්බං විපාකවට්ටසඞ්ඛාතං දුක්ඛං වීතිවත්තෙ "ජානිස්සති" ති ඉදං "යත්‍රහි" ති නිපාතවසෙන අනාගතවචනං, අත්ථො පනෙත්ථ අතීතවසෙන වෙදිතබ්බො—භගවාහි තෙ බුද්ධෙ අනුස්සරිස්සති "එවංජච්චා"ති විපස්සීආදයො ඛත්තියජච්චා කකුසන්ධාදයො බ්‍රාහ්මණජච්චාති "එවංගොත්තා"ති විපස්සීආදයො කොණ්ඩඤ්ඤගොත්තා කකුසන්ධාදයො කස්සපගොත්තාති—"එවංසීලා"ති ලොකියලොකුත්තරසීලෙන එවංසීලා "එවංධම්මා"ති එත්ථ සමාධිපක්ඛා ධම්මා අධිප්පෙතා, ලොකියලොකුත්තරෙන සමාධිනා එවංසමාධිනො'ති අත්ථො—"එවංපඤ්ඤා" ති ලොකියලොකුත්තරපඤ්ඤාය එවංපඤ්ඤා "එවංවිහාරී"ති එත්ථ පන හෙට්ඨා සමාධිපක්ඛානං ධම්මානං ගහිතත්තා විහාරො ගහිතො ච පුන කස්මා ගහිතමෙව ගණ්හාතී'ති චෙ න ඉදං ගහිතමෙව ඉදංහි නිරොධසමාපත්තිදීපනත්ථං තස්මා එවංනිරොධසමාපත්තිවිහාරී'ති අයමෙත්ථ අත්ථො "එවංවිමුත්තා"ති එත්ථ වික්ඛම්භනවිමුත්ති තදඞ්ගවිමුත්ති සමුච්ඡෙදවිමුත්ති පටිප්පස්සද්ධිවිමුත්ති නිස්සරණවිමුත්ති'ති පඤ්චවිධා විමුත්ති තත්ථ අට්ඨසමාපත්තියො සයං වික්ඛම්භිතෙහි නීවරණාදීහි විමුත්තත්තා වික්ඛම්භනවිමුත්ති'ති සඞ්ඛං ගච්ඡන්ති–

අනිච්චානුපස්සනාදිකා සත්තඅනුපස්සනා සයං තස්ස තස්ස පච්ච නීකඞ්ගවසෙන පරිච්චත්තානි නිච්චසඤ්ඤාදීහි විමුත්තත්තා තදඞ්ග විමුත්තී'ති සඞ්ඛං ගච්ඡන්ති—චත්තාරො අරියමග්ගා සයං සමුච්ඡින්නෙ හි කිලෙසෙහි විමුත්තත්තා සමුච්ඡෙදවිමුත්තී'ති සඞ්ඛං ගච්ඡන්ති—ච ත්තාරො සාමඤ්ඤඵලානි මග්ගානුභාවෙන කිලෙසානං පටිප්පස්සද්ධ න්තෙ උප්පන්නත්තා පටිප්පස්සද්ධිවිමුත්තී'ති සඞ්ඛං ගච්ඡන්ති—නිබ්බා ණං සබ්බකිලෙසෙහි නිස්සටත්තා නිස්සරණවිමුත්තී'ති සඞ්ඛං ගච්ඡ න්ති—ඉති ඉමාසං පඤ්චන්නං විමුත්තීනං වසෙන එවං විමුත්තා 'ති එව මෙත්ථ අත්ථො දට්ඨබ්බො—"තස්මාතිහා"ති යස්මා ත්වං තථාගතා අච්ඡරියාසි වදසි තස්මා තං භිය්‍යොසොමත්තාය පටිභාතු තථාග තස්ස අච්ඡරියඅබ්භුතධම්මා'ති—"සතො සම්පජානො"ති එත්ථ ච සම්පජඤ්ඤ'න්ති මනුස්සලොකෙ දෙවලොකෙච, තත්ථ වෙස්සන්තරජා තකෙ බ්‍රාහ්මණස්ස වෙ පුත්තෙ දත්වා පුනදිවසෙ සක්කස්ස දෙවිං දත්වා සක්කෙන පසීදිත්වා අට්ඨවරෙ ගණ්හන්තො—

ඉතො විමුච්චමානොහං සග්ගගාමි විසෙසගු
අනිබ්බත්තී තතො අස්ස අට්ඨමෙතං වරංවරෙ'ති.

එවං තුසිතභවනෙ මෙ පටිසන්ධි හොතූ'ති වරං අග්ගහෙසි ත තො පට්ඨාය තුසිතභවනෙ උප්පජ්ජිස්සාමී'ති ජානාති, ඉදං මනුස්ස ලොකෙ සම්පජඤ්ඤං—වෙස්සන්තරත්තභාවතො පන චුතො තුසි තභවනෙ නිබ්බත්තිත්වා නිබ්බත්තොස්මී'ති අඤ්ඤාසි, ඉදං දෙවලො කෙ සම්පජඤ්ඤං—කිංපනස්ස දෙවතා නජානන්තී'ති නො නජාන න්ති තාපන උය්‍යානවිමානකප්පරුක්ඛෙ ඔලොකෙත්වා දෙවතා ටකෙහි තුරියසද්දෙන පබොධිතා මාරිස අයං දෙවලොකො තුම්හෙ ඉධ නිබ්බත්තා'ති සාරිකා ජානන්ති බොධිසත්තො පඨමජවනවා රෙන ජානාති දුතියජවනතොපට්ඨාය ජානාති ඉච්චස්ස අඤ්ඤෙහි අ සාධාරණං ජානනං හොති—"අට්ඨාසී"ති එත්ථ කිඤ්චා'පි අඤ්ඤෙ'පි දෙ වා තත්ථ ඨිතා ඨිතම්හා'ති ජානන්ති තෙපන ඡසු ද්වාරෙසු බලවතා ඉට්ඨාරම්මණෙන අභිභූය්‍යමානා සතිං විස්සජ්ජෙත්වා අත්තනො භුත්ත පීතභාවම්පි අජානන්තා ආහරූපච්ඡෙදෙන කාලංකරොන්ති බො ධිසත්තස්ස කිං තථාරූපං ආරම්මණං නත්ථී'ති නො නත්ථි සොහි සෙ සදෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති ආරම්මණෙන පන අත්තා නං මද්දිතුං නදෙති තං ආරම්මණං අභිභවිත්වා තිට්ඨති තෙන වු ත්තං "සතො සම්පජානො ආනන්ද බොධිසත්තො තුසිතෙ කායෙ අට්ඨාසී"ති—"යාවතායුක"න්ති සෙසත්තභාවෙසු කිං යාවතායුකං

තිඨන්ති ආම න තිඨන්ති අඤ්ඤෑදදිහි දීඝායුකදෙවලොකෙ නිබ්බත්තෙනා
තඤ් පාරමියො න සක්කා පූරෙතුන්ති අක්ඛීනි නිම්මීලෙත්වා අධිමු
ත්තිකාලකිරියං නාම කත්වා මනුස්සලොකෙ නිබ්බත්තන්ති අයංකා
ලකිරියා අඤ්ඤෙසං න හොති තදා පන අදින්නං දානං නාම නත්ථි
අරක්ඛිතං සීලං නාම නත්ථී'ති සබ්බපාරමීනං පූරිතත්තා යාවතායු
කං අට්ඨාසි—"සතො සම්පජානො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔ
ක්කමතී"ති එවං තාව සබ්බපාරමියො පූරෙත්වා තදා බොධිසත්තො
යාවතායුකං අට්ඨාසි දෙවතානං පන මනුස්සගණනාවසෙන ඉදානි
සත්තාහි දිවසෙහි චුති භවිස්සතී'ති පඤ්ච පුබ්බනිමිත්තානි උප්පජ්ජන්ති—
මාලා මිලායන්ති—වත්ථානි කිලිස්සන්ති—කච්ඡෙහි සෙදා මුච්චන්ති—කා
යෙ දුබ්බණ්ණියං ඔක්කමති—දෙවො දෙවාසනෙ න සණ්ඨාති—තත්ථ—
"මාලා"ති පටිසන්ධිග්ගහණ දිවසෙ පිළන්ධන මාලා තා කිර සට්ඨිසතස
හස්සාධිකා සත්තපණ්ණාසකොටියො අමිලායිත්වා තදා මිලායන්ති—ව
ත්ථෙසු'පි එසෙව නයො—එත්තකං පන කාලං දෙවානං නෙව සීතං න
උණ්හං හොති තස්මිං කාලෙ සරීරතො බින්දුබින්දුවසෙන සෙදා මුච්ච
න්ති එත්තකඤ්ච කාලං තෙසං සරීරෙ ඛණ්ඩිච්චපාලිච්චාදිවසෙන විව
ණ්ණතා න පඤ්ඤායති දෙවධීතා සොළසවස්සුද්දෙසිකා විය දෙවපු
ත්තා වීසතිවස්සුද්දෙසිකා විය ඛායන්ති මරණකාලෙ පන තෙසං කිල
න්තරූපො අත්තභාවො හොති එත්තකඤ්ච තෙසං කාලං දෙවලො
කෙ උක්කණ්ඨිතා නාම නත්ථි මරණකාලෙ පන නිස්සසන්ති විජ
ම්භන්ති සකෙ ආසනෙ නාභිරමන්ති, ඉමානි පන පුබ්බනිමිත්තානි ය
ථා ලොකෙ මහාපුඤ්ඤානං රාජරාජමහාමත්තාදීනං යෙව උක්කාපා
ත භූමිචාලචන්දග්ගාහාදීනිමිත්තානි පඤ්ඤායන්ති න සබ්බෙසං එව
මෙවං මහෙසක්ඛානං දෙවතානංයෙව පඤ්ඤායන්ති න සබ්බෙසං යථා
ච මනුස්සෙසු පුබ්බනිමිත්තානි නක්ඛත්තපාඨකාදයොව ජානන්ති ස
බ්බෙ එවං තානි'පි සබ්බදෙවතා න ජානන්ති පණ්ඩිතා එව පන ජාන
න්ති තත්ථ යෙ මන්දෙන කුසලකම්මෙන නිබ්බත්තා දෙවපුත්තා තෙසු
තෙසු උප්පන්නෙසු ඉදානි කො ජානාති කුහිම්පි නිබ්බත්තිස්සාමා'ති භා
යන්ති යෙ මහාපුඤ්ඤා අම්හෙහි දින්නං දානං රක්ඛිතං සීලං භාවිතං
භාවනං ආගම්ම උපරිදෙවලොකෙසු සම්පත්තිං අනුභවිස්සාමා'ති න භා
යන්ති බොධිසත්තො'පි තානි පුබ්බනිමිත්තානි දිස්වා ඉදානි අනන්ත
රෙ අත්තභාවෙ බුද්ධො භවිස්සාමී'ති න භායි.

අථස්ස තෙසු නිමිත්තෙසු පාතුභූතෙසු දසසහස්සචක්කවාළෙ
දෙවතා සන්නිපතිත්වා මාරිස තුම්හෙහි දසපාරමියො පූරෙන්තෙහි න
සක්කසම්පත්තිං න මාරබ්‍රහ්මචක්කවත්තිසම්පත්තිං පත්ථෙන්තෙහි

පූරිතා ලොකනිත්ථරණත්ථාය පන බුද්ධත්තං පත්ථයමානෙහි පූරිතා සොව ඉදානි "කාලොමාරිස බුද්ධත්තාය සමයො මාරිස බුද්ධත්තායා" ති යාචන්ති අථ මහාසත්තො දෙවතානං පටිඤ්ඤං අදත්වාව කාල දීප දෙස කුල ජනෙත්ති ආයු පරිච්ඡෙදවසෙන පඤ්චමහාවිලොකනංනාම විලොකෙසි–තත්ථ කාලො නුඛො න කාලො'ති පඨමං කාලං විලොකෙසි–තත්ථ වස්ස සතසහස්සතො උද්ධං වඩ්ඪිත ආයුකාලො කාලො නාම න හොති කස්මා තදාහි සත්තානං ජාතිජරාමරණානි න පඤ්ඤායන්ති බුද්ධානඤ්ච ධම්මදෙසනානාම තිලක්ඛණමුත්තා නත්ථි තෙසං අනිච්චං දුක්ඛමනත්තා'ති කථෙන්තානං කිංනාමෙතං. කථෙන්තී'ති නෙව සොතුං න සද්ධාතුං මඤ්ඤන්ති තතො අභිසමයො න හොති තස්මිං අසති අනීය්‍යානිකං සාසනං හොති තස්මා සො ආකාලොවස්ස සතතො ඌනආයුකාලො'පි කාලො නහොති කස්මා තදා සත්තා උස්සන්නකිලෙසා හොන්ති උස්සන්නකිලෙසානඤ්ච දින්නො ඔවාදො ඔවාදට්ඨානෙ න තිට්ඨති උදකෙ දණ්ඩරාජි විය ඛිප්පං විගච්ඡති තස්මා සොපි අකාලො සතසහස්සතො පන පට්ඨාය හෙට්ඨා වස්ස සතතො පට්ඨාය උද්ධං ආයුකාලො කාලොනාම තදාච වස්සසතකාලො හොති අථ මහාසත්තො නිබ්බත්තිතබ්බ කාලොති කාලං පස්සි–තතො දීපං ඔලොකෙන්තො සපරිවාරෙ චත්තාරො දීපෙ ඔලොකෙත්වා තීසු දීපෙසු බුද්ධා න නිබ්බත්තන්ති ජම්බුදීපෙයෙව නිබ්බත්තන්තී'ති දීපං පස්සි තතො ජම්බුදීපො නාම මහා දසයොජනසහස්සපරිමාණො කතරස්මිං නුඛො පදෙසෙ බුද්ධා නිබ්බත්තන්තී'ති දෙසං විලොකෙන්තො මජ්ඣිමපදෙසං පස්සිමජ්ඣිමපදෙසොනාම පුරත්ථිමාය දිසාය කජඞ්ගලංනාම නිගමොති ආදිනා නයෙන විනයෙ වුත්තොව සො ආයාමතො තීනි යොජනසතානි විත්ථාරතො අඩ්ඪතියානි පරික්ඛෙපතො නවයොජනසතානි'ති...එතස්මිං හි පදෙසෙ බුද්ධා පච්චෙකබුද්ධා අග්ගසාවකා අසීතිමහාසාවකා චක්කවත්තිරාජා අඤ්ඤෙච මහෙසක්ඛා ඛත්තියබ්‍රාහ්මණගහපතිමහාසාලා උප්පජ්ජන්ති ඉදං චෙත්ථ කපිලවත්ථුනාම නගරං තත්ථ මයා නිබ්බත්තිතබ්බන්ති නිට්ඨං අගමාසි...තතො කුලං විලොකෙන්තො බුද්ධානාම ලොකසම්මතෙ කුලෙ නිබ්බත්තන්ති ඉදානි ච ඛත්තියකුලං ලොකසම්මතං තත්ථ නිබ්බත්තිස්සාමි සුද්ධොදනො නාම රාජා මෙ පිතා භවිස්සතී'ති කුලං පස්සි–තතො මාතරං විලොකෙන්තො බුද්ධමාතා නාම ලොලා සුරාධුත්තා නහොති කප්පසතසහස්සපූරිතපාරමී ජාතිතොපට්ඨාය අඛණ්ඩපඤ්චසීලා හොති අයඤ්ච මහාමායා නාම දෙවී එදිසා අයං මෙ මාතා භවිස්සති කිත්තකං පනස්සා ආයූන්ති දසන්නං මාසානං උපරි සත්තදිවසානි පස්සි–ඉති ඉමං පඤ්චවිලොකනං විලොකෙත්වා "කාලො මෙ මාරිසා බුද්ධභාවායා" ති දෙව

තානං සඞ්ගහං කරොන්තො පටිඤ්ඤං දත්වා "ගච්ඡථ තුම්හෙ"ති තා දෙවතා උය්‍යොජෙත්වා තුසිතදෙවතාහි පරිවුතො තුසිතපුරෙ නන්දනවනං පාවිසි සබ්බදෙවලොකෙසු හි නන්දනවනං අත්ථියෙව තත්ථ නං දෙවතා ඉතො චුතො සුගතිං "ගච්ඡ ඉතො චුතො සුගතිං ගච්ඡා"'ති පුබ්බෙ කතකුසලකම්මොකාසං සාරයමානා විචරන්ති සො එවං දෙවතාහි කුසලං සාරයමානාහි පරිවුතො තත්ථ විචරන්තොව චවි එවං චුතො චවාමී'ති ජානාති චුතිචිත්තං නජානාති පටිසන්ධිං ගහෙත්වා පටිසන්ධිචිත්තමෙව නජානාති "ඉමස්මිං මෙ ඨානෙ පටිසන්ධිං ගහිතා"ති එවං පන නජානාති කෙචිපන ථෙරා "ආවජ්ජනපරියායො නාම ලද්ධුං වට්ටති දුතිය තතියචිත්තවාරෙයෙව ජානිස්සතී"ති වදන්ති–තිපිටක මහාසීවත්ථෙරොපන "මහාසත්තානං පටිසන්ධිං නඅඤ්ඤෙසං පටිසන්ධිසදිසා කොටිප්පත්තං තෙසං සතිසම්පජඤ්ඤං යස්මාපන තෙනෙව චිත්තෙන තං චිත්තං ඤාතුං නසක්කා තස්මා චුති චිත්තං නජානාති චුති ඛණෙපි චවාමී'ති ජානාති පටිසන්ධිචිත්තං නජානාති අසුකස්මිං මෙ ඨානෙ පටිසන්ධිගහිතා'ති ජානාති තස්මිං කාලෙ දස සහස්සී කම්පති,,ති එවං මාතුකුච්ඡිං ඔක්කමන්තොපන එකූනවීසතියා පටිසන්ධිචිත්තෙසු මෙත්තාපුබ්බභාගස්ස සොමනස්සසහගතඤාණසම්පයුත්තඅසංඛාරිකකුසලචිත්තස්ස සදිසං මහාවිපාකචිත්තෙන පටිසන්ධිං ගණ්හි මහාසීවත්ථෙරොපන "උපෙක්ඛාසහගතෙනා"ති ආහ පටිසන්ධිං ගණ්හන්තොපන ආසාළ්හීපුණ්ණමාය උත්තරසාළ්හනක්ඛත්තෙන අග්ගහෙසි තදා කිර මහාමායා පුරෙ පුණ්ණමාය සත්තමදිවසතො පට්ඨාය විගතසුරාපානං මාලාගන්ධවිභූතිසම්පන්නං නක්ඛත්තකීළං අනුභවමානා සත්තමෙ දිවසෙ පාතොව උට්ඨාය ගන්ධොදකෙන නහායිත්වා සබ්බාලංකාරවිභූසිතා වරභොජනං භුඤ්ජිත්වා උපොසථඞ්ගානි අධිට්ඨාය සිරිගබ්භං පවිසිත්වා සිරිසයනෙ නිපන්නා නිද්දං ඔක්කමමානා ඉමං සුපිනං අද්දස "චත්තාරො කිර නං මහාරාජානො සයනෙනෙව සද්ධිං උක්ඛිපිත්වා අනොතත්තදහං නෙත්වා එකමන්තං අට්ඨංසු අථ නෙසං දෙවියො ආගන්ත්වා මානුසමලහරනත්ථං නහාපෙත්වා දිබ්බවත්ථං නිවාසෙත්වා ගන්ධෙහි විලිම්පිත්වා දිබ්බපුප්ඵානි පිළන්ධිත්වා තතො අවිදූරෙ රජතපබ්බතො තස්ස අන්තො කනකවිමානං අත්ථි තස්මිං පාචීනතො සීසං කත්වා නිපජ්ජාපෙසුං අථ බොධිසත්තො සෙතවරවාරණො හුත්වා තතො අවිදූරෙ එකො සුවණ්ණපබ්බතො තත්ථ චරිත්වා තතො ඔරුය්හ රජත පබ්බතං අභිරුහිත්වා උත්තරදිසතො ආගම්ම කනකවිමානං පවිසිත්වා මාතරං පදක්ඛිණං කත්වා දක්ඛිණපස්සං ඵාලෙත්වා කුච්ඡිං පවිට්ඨසදිසො අහොසි" අථ පබුද්ධා දෙවී තං සුපි

නං රඤ්ඤො ආරොචෙසි රාජා විභාතාය රත්තියා චතුසට්ඨිමත්තෙ බ්‍රාහ්මණපාමොක්ඛෙ පක්කොසාපෙත්වා හරිතූපලිත්තාය ලාජාදීහි කතමඞ්ගලසක්කාරාය භූමියා මහාරහානි ආසනානි පඤ්ඤපෙත්වා තත්ථ නිසින්නානං බ්‍රාහ්මණානං සප්පිමධුසක්ඛරාභිසංඛතස්ස වරපායාසස්ස සුවණ්ණරජතපාතියො පූරෙත්වා සුවණ්ණරජතපාතීහියෙව පටිකුජ්ජිත්වා අදාසි අඤ්ඤෙහි ච අහතවත්ථකපිලගාවිදානාදීහි තෙ සන්තප්පෙසි—අථ තෙසං සබ්බකාමසන්තප්පිතානං සුපිනං ආරොචෙත්වා "කිං භවිස්සතී"ති පුච්ඡි බ්‍රාහ්මණා අහංසු "මා චින්තයි මහාරාජ දෙවියා තෙ කුච්ඡිම්හි ගබ්භො පතිට්ඨිතො සො ච ඛො පුරිසගබ්භො න ඉත්ථිගබ්භො පුත්තො තෙ භවිස්සති සො සචෙ අගාරං අජ්ඣාවසිස්සති රාජා භවිස්සති චක්කවත්තී සචෙ අගාරා නික්ඛම්ම පබ්බජිස්සති බුද්ධො භවිස්සති ලොකෙ විවට්ටච්ඡදො"ති එවං "සතො සම්පජානො ආනන්ද බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති "තත්ථ "සතොසම්පජානො"ති ඉමිනා චතුත්ථා ගබ්භාවක්කන්තියා ඔක්කමන්තිං දස්සෙති—චතස්සො හි ගබ්භාවක්කන්තියො 'චතස්සො ඉමා භන්තෙ ගබ්භාවක්කන්තියො, ඉධ භන්තෙ එකච්චො අසම්පජානොව මාතුකුච්ඡිං ඔක්කමති අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති අසම්පජානො මාතුකුච්ඡිස්මා නික්ඛමති අයං පඨමා ගබ්භාවක්කන්ති—පුනචපරං භන්තෙ ඉධෙකච්චො සම්පජානො හි ඛො මාතුකුච්ඡිං ඔක්කමති අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති අසම්පජානො මාතුකුච්ඡිස්මා නික්ඛමති අයං දුතියා ගබ්භාවක්කන්ති-පුනචපරං භන්තෙ ඉධෙකච්චො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති අසම්පජානො මාතුකුච්ඡිස්මා නික්ඛමති අයං තතියා ගබ්භාවක්කන්ති—පුනච පරං භන්තෙ ඉධෙකච්චො සම්පජානොව මාතුකුච්ඡිං ඔක්කමති සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති සම්පජානො මාතුකුච්ඡිස්මා නික්ඛමති අයං චතුත්ථා ගබ්භාවක්කන්ති'ති" එතාසු පඨමා ලොකියමනුස්සානං හොති දුතියා අසීති මහාසාවකානං තතියා චත්තං අග්ගසාවකානං පච්චෙකබොධිසත්තානංච එතෙ කිර කම්මජහි වාතෙහි උද්ධපාදා අධොසිරා අනෙකසතපොරිසෙ පපාතෙ විය යොනිමුඛෙ ඨිතා තාලච්ඡිග්ගලෙන හත්ථිවිය සම්බාධෙන යොනිමුඛෙන නික්ඛමමානා අනන්තං දුක්ඛං පාපුණන්ති තෙන තෙසං මයං නික්ඛමාමාති සම්පජානතා න හොති චතුත්ථාය සබ්බඤ්ඤු බොධිසත්තානං තෙහි මාතුකුච්ඡිස්මිං පටිසන්ධිං ගණ්හන්තා'පි ජානන්ති තත්ථ වසන්තා'පි ජානන්ති නික්ඛමනකාලෙ'පිච තෙසං කම්මජවාතා උද්ධපාදෙ අධොසිරෙ කත්වා ඛිපිතුං න සක්කොන්ති ද්වෙ හත්ථෙ පසාරෙත්වා අක්ඛීනි උම්මිලෙත්වා ඨිතකාව නික්ඛමන්තීති—

"කුච්ඡිං ඔක්කමතී"ති එත්ථ කුච්ඡිං ඔක්කන්තො හොති'ති අත්ථො–ඔක්කමන්තෙ හි තස්මිං එවං හොති නඔක්කමමානෙ "අප්පමාණො"ති බුද්ධප්පමාණො, විපුලො'ති අත්ථො "උළාරො"ති තස්සෙව වෙවචනං "දෙවානං දෙවානුභාව"න්ති එත්ථ දෙවානං අයමානුභාවො නිවත්ථවත්ථස්ස පභා ද්වාදසයොජනානි ඵරති තථා සරීරස්ස තථා අලඞ්කාරස්ස තථා විමානස්ස තං අතික්කමිත්වා'ති අත්ථො "ලොකන්තරිකා"ති තිණ්ණං තිණ්ණං චක්කවාළානං අන්තරා එකෙකා ලොකන්තරිකා හොති තිණ්ණං සකටචක්කානං පත්තානං වා අඤ්ඤමඤ්ඤං ආහච්ච ඨපිතානං මජ්ඣෙ ඔකාසො විය, සො පන ලොකන්තරිකනිරයො පමාණතො අට්ඨයොජනසහස්සො හොති– "අඝා"ති නිච්චවිවටා– "අසංවුතා"ති හෙට්ඨා'පි අප්පතිට්ඨා "අන්ධකාරා"ති තමභූතා "අන්ධකාරතිමිසා"ති චක්ඛුවිඤ්ඤාණුප්පත්තිනිවාරණතො අන්ධභාවකරණතිමිසෙන සමන්නාගතා තත්ථ කිර චක්ඛුවිඤ්ඤාණං න ජායති "එව මහිද්ධිකා"ති චන්දිමසූරියා කිර එකප්පහාරෙනෙව තීසු දීපෙසු පඤ්ඤායන්ති එවංමහිද්ධිකා එකෙකාය දිසාය නව නව යොජනසහස්සානි අන්ධකාරං විධමිත්වා ආලොකං දස්සෙන්ති එවං මහානුභාවා "නානුභොන්තී"ති අත්තනො පභාය නප්පහොන්ති තෙ කිර චක්කවාළපබ්බතස්ස වෙමජ්ඣෙන චරන්ති චක්කවාළපබ්බතඤ්ච අතික්කම්ම ලොකන්තරනිරයො හොති තස්මා තෙ තත්ථ ආභාය නප්පහොන්ති "යෙ'පි තත්ථ සත්තා"ති යෙ'පි තස්මිං ලොකන්තරිකමහානිරයෙ සත්තා උප්පන්නා කිං පන කම්මං කත්වා තත්ථ උප්පජ්ජන්තීති භාරියං දාරුණං මාතාපිතූනං ධම්මිකසමණබ්‍රාහ්මණානඤ්ච උපරි අපරාධං අඤ්ඤඤ්ච දිවසෙ දිවසෙ පාණවධාදිසාහසිකකම්මං කත්වා උප්පජ්ජන්ති තම්බපණ්ණිදීපෙ අභයචොරනාගචොරාදයො විය–තෙසං අත්තභාවො තිගාවුතිකො හොති වග්ගුලීනං විය දීඝා නඛා හොන්ති තෙ රුක්ඛෙ වග්ගුලියො විය නඛෙහි චක්කවාළපාදෙ ලග්ගන්ති යදා සංසප්පන්තා අඤ්ඤමඤ්ඤස්ස හත්ථපාසගතා හොන්ති අථ භක්ඛො නො ලද්ධො'ති මඤ්ඤමානා තත්ථ වාවටා විපරිවත්තිත්වා ලොකසන්ධාරකඋදකෙ පතන්ති වාතෙ පහරන්තෙ'පි මධුකඵලානි විය ඡිජ්ජිත්වා උදකෙ පතන්ති පතිතමත්තාව අච්චන්තඛාරෙ උදකෙ පිට්ඨපිණ්ඩි විය විලීයන්ති "අඤ්ඤෙ'පි කිර භො සන්ති සත්තා"ති භො යථා මයං මහාදුක්ඛං අනුභවාම එවං අඤ්ඤෙ'පිකිර සත්තා ඉමං දුක්ඛමනුභවන්තා ඉධූපපන්නා තං දිවසං පස්සන්ති අයං පන ඔභාසො එකයාගුපානමත්තම්පි නතිට්ඨති යාවතා නිද්දායිත්වා පබුද්ධො ආරම්මණං විභාවෙති තත්තකං කාලං හොති–දීඝභාණකාපන අච්ඡරාසඞ්ඝාතමත්තං

මෙව විපුලොභාසො නිච්ඡරිත්වා කිං ඉදන්ති හනනන්තානං යෙව අන්ත
රධායතීති වදන්ති “සංකම්පතී”ති සමන්තතො කම්පති, ඉතරද්වයං
පුරිම පදස්ස වෙවචනං පුන “අප්පමාණො ච”’ති ආදි නිගමන
ත්ථං වුත්තං “චත්තාරො නං දෙවපුත්තා චතුද්දිසා රක්ඛාය උපග
ච්ඡන්තී”ති එත්ථ ‘චත්තාරො’ති චතුන්නං මහාරාජානං වසෙන වුත්තං
දසසහස්සචක්කවාළෙ පන චත්තාරො චත්තාරො කත්වා චත්තාළී
සසහස්සානි හොන්ති තත්ථ ඉමස්මිං චක්කවාළෙ මහාරාජානො ඛග්ගහ
ත්ථා බොධිසත්තස්ස ආරක්ඛත්ථාය උපගන්ත්වා සිරිගබ්භං පවිට්ඨා ඉතරෙ
ගබ්භද්වාරතො පට්ඨාය අවිරුද්ධක පංසුපිසාචකාදි යක්ඛගණෙ පටි
ක්කමාපෙත්වා යාව චක්කවාළා ආරක්ඛං ගණ්හිංසු–කිමත්ථාය පනායං
රක්ඛා–නනු පටිසන්ධික්ඛණෙ කලලකාලතො පට්ඨාය සචෙ’පි කොටිස
තසහස්සමාරා කොටිසතසහස්සං සිනෙරුං උක්ඛිපිත්වා බොධිසත්ත
ස්ස වා බොධිසත්තමාතුයා වා අන්තරාය කරණත්ථං ආගච්ඡෙය්‍යුං
සබ්බෙ අන්තරාව අන්තරධායෙය්‍යුං, වුත්තම්පි චෙතං භගවතා රුහිරු
ප්පාදවත්ථුස්මිං–“අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං පරූපක්ක
මෙන තථාගතං ජීවිතා වොරොපෙය්‍ය අනුපක්කමෙන භික්ඛවෙ ත
ථාගතා පරිණිබ්බායන්ති ගච්ඡථ තුම්හෙ භික්ඛවෙ යථා විහාරං අර
ක්ඛියා භික්ඛවෙ තථාගතා’ති එවමෙතං නපරූපක්කමෙන තෙසං
ජීවිතන්තරායො අත්ථි සන්ති ඛො පන අමනුස්සා විරූපා දුද්දසිකා භෙ
රවරූපා පක්ඛිණො යෙසං රූපං දිස්වා සද්දං වා සුත්වා බොධිසත්තමාතු
භයං සන්තාසො වා උප්පජ්ජෙය්‍ය තෙසං නිවාරණත්ථාය රක්ඛං අග්ග
හෙසුං අපිච බොධිසත්තස්ස පුඤ්ඤතෙජෙන සඤ්ජාතගාරවා අත්ත
නො ගාරවචොදිතා’පි තෙ එවමකංසු කිම්පන තෙ අන්තොගබ්භං පවි
සිත්වා ඨිතා චත්තාරො මහාරාජානො බොධිසත්තමාතු අත්තානං ද
ස්සෙන්ති’ති නහාන මණ්ඩන භොජනාදිසරීරකිච්චකාලෙ පන න දස්සෙ
න්ති සිරිගබ්භං පවිසිත්වා වරසයනෙ නිපන්නකාලෙ පන දස්සෙන්ති
තත්ථ කිඤ්චා’පි අමනුස්සදස්සනං නාම මනුස්සානං සප්පටිභයං හොති
බොධිසත්තමාතා පන අත්තනො චෙව පුත්තස්සච පුඤ්ඤානුභාවෙ
න තෙ දිස්වා න භායති පකති අන්තෙපුරපාලකෙසු විය අස්සා තෙසු
චිත්තං උප්පජ්ජති “පකතියා සීලවතී”’ති සභාවෙනෙව සීලසම්ප
න්නා අනුප්පන්නෙ කිර බුද්ධෙ මනුස්සා තාපසපරිබ්බාජකානං ස
න්තිකෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා සීලං ගණ්හන්ති බොධිස
ත්තමාතා’පි කාලදෙවලස්ස ඉසිනො සන්තිකෙ ගණ්හාති බොධිස
ත්තෙ පන කුච්ඡිගතෙ අඤ්ඤස්ස පාදමූලෙ නිසීදිතුං නාම න සක්කා ස
මාසනෙ නිසීදිත්වා ගහිතසීලම්පි අවඤ්ඤාකාරමත්තං හොති තස්මා

සයමෙව සීලං ගණ්හාතී'ති වුත්තං හොති. "පුරිසෙසූ"ති බොධිසත්ත
පිතරං ආදිං කත්වා තෙසු මනුස්සෙසු පුරිසාධිප්පාය චිත්තං නුප්පජ්ජති
තඤ්ච ඛො බොධිසත්තෙ ගාරවෙන න පහීනකිලෙසතාය, බොධිසත්ත
මාතු රූපං පන සුකුසලසිප්පිකාපි පොත්ථකම්මාදීසු'පි කාතුං න සක්කො
න්ති තං දිස්වා පුරිසස්ස රාගො නුප්පජ්ජතී'ති න සක්කා වත්තුං සචෙ ප
න තං රත්තචිත්තො උපසඞ්කමිතුකාමො හොති පාදා න වහන්ති දිබ්බ
සඞ්ඛලිකාය බජ්ඣන්ති තස්මා 'අනතික්කමනීයා'ති ආදි වුත්තං...... 'පඤ්ච
න්නං කාමගුණාන"න්ති පුබ්බෙ කාමගුණූපසංහිතන්ති පුරිසාධිප්පාය ව
සෙන වත්ථුපටික්ඛෙපො කථිතො ඉධ ආරම්මණපටිලාභො දස්සිතො ත
දා කිර දෙවියා එවරූපො පුත්තො කුච්ඡිස්මිං උප්පන්නො'ති සුත්වා ස
මන්තතො රාජානො මහග්ඝාභරණතූරියාදිවසෙන පඤ්චද්වාරාරම්මණව
ත්ථුභූතං පණ්ණාකාරං පෙසෙන්ති බොධිසත්තස්ස ච බොධිසත්තමාතුං
ච කතකම්මස්ස උස්සන්නත්තා ලාභසක්කාරස්ස පමාණපරිච්ඡෙදො
නාම නත්ථි "අකිලන්තකායා"ති යථා ඉත්ථියො ගබ්භභාරෙන කිලම
න්ති හත්ථපාදා උද්ධුමාතකාදීනි පාපුණන්ති න එවං තස්සා කොචි කි
ලමථො අහොසි "තිරොකුච්ඡිගත"න්ති අන්තො කුච්ඡිගතං කලලාදි
කාලං අතික්කමිත්වා සඤ්ජාතඅඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියභාවං උපගතංයෙව
පස්සති කිමත්ථං පස්සති සුඛවාසත්ථං යථෙව හි මාතා පුත්තෙන සද්ධිං
නිසින්නා වා නිපන්නා වා හත්ථං වා පාදං වා ඔලම්බන්තං උක්ඛිපිත්වා ස
ණ්ඨපෙස්සාමී'ති සුඛවාසත්ථං පුත්තං ඔලොකෙති එවං බොධිසත්තමා
තා'පි යන්තං මාතු උට්ඨානගමනපරිවත්තනනිසජ්ජාදීසු උණ්හසීතලො
ණිකතිත්තකටුකාහාරෙ අජ්ඣොහරණකාලෙ සුච ගබ්භස්ස දුක්ඛං උප්ප
ජ්ජති...... "අත්ථිනුඛො මෙතං පුත්තස්සා"ති සුඛවාසත්ථං බොධිස
ත්තං ඔලොකයමානා පල්ලඞ්කං ආභුජිත්වා නිසින්නං බොධිසත්තං
පස්සති යථාහි අඤ්ඤෙ අන්තො කුච්ඡිගතා පක්කාසයං අජ්ඣොත්ථ
රිත්වා ආමාසයං උක්ඛිපිත්වා උදරපටලෙ පිට්ඨිතො කත්වා පිට්ඨිකණ්ට
කං නිස්සාය උක්කුටිකා ද්වීසු මුට්ඨීසු හනුකං ඨපෙත්වා දෙවෙ වස්සන්තෙ
රුක්ඛසුසිරෙ මක්කටාවිය නිසීදන්ති න එවං බොධිසත්තො බොධිස
ත්තො පන පිට්ඨිකණ්ටකං පිට්ඨිතො කත්වා ධම්මාසනෙ ධම්මකථිකොවිය
පල්ලඞ්කං ආභුජිත්වා පුරත්ථාභිමුඛො නිසීදති පුබ්බෙකතකම්මං පන
ස්ස වත්ථුං සොධෙති–සුද්ධෙ වත්ථුම්හි සුඛුමච්ඡවි ලක්ඛණං නිබ්බත්ත
ති අථනං කුච්ඡිගතම්පි පටිච්ඡාදෙතුං න සක්කොන්ති ඔලොකෙන්ති
යා බහි ඨිතො විය පඤ්ඤායති තමත්ථං උපමාය විභාවෙන්තො "සෙ
ය්‍යථාපී"ති ආදිමාහ–බොධිසත්තො පන අන්තොකුච්ඡිගතො මාතරං
න පස්සති නහි අන්තොකුච්ඡියං චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජති–"කාලංක

රොතී"ති විජාතභාව පච්චයා ආයුපරික්ඛයෙනෙව බොධිසත්තෙන වසිතට්ඨානංහි චෙතියකුටිසදිසා හොති අඤ්ඤෙසං අපරිභොගං න ච සක්කා බොධිසත්තමාතරං අපනෙත්වා අඤ්ඤං අග්ගමහෙසිට්ඨානෙ ඨපෙතුන්ති තත්තකං යෙව බොධිසත්තමාතු ආයුප්පමාණං හොති තස්මා තදා කාලං කරොති කතරස්මිං පන ච වයෙ කාලං කරොතී'ති මජ්ඣිමවයෙ, පඨමවයස්මිංහි සත්තානං අත්තභාවෙ ඡන්දරාගො බලවා හොති තදාසඤ්ජාතගබ්භා ඉත්ථිගබ්භංඅනුරක්ඛිතුං නසක්කොති ගබ්භො බව්හාබාධොහොති මජ්ඣිමවයස්ස පන ද්වෙකොට්ඨාසෙ අතික්කම්ම තතියකොට්ඨාසෙ වත්ථුං විසදංහොති විසදෙ වත්ථුම්හි නිබ්බත්තා දාරකා ආරොගා හොන්ති තස්මා බොධිසත්තමාතා'පි පඨමවයෙ සම්පත්තිං අනුභවිත්වා මජ්ඣිමවයස්ස තතියකොට්ඨාසෙ විජායිත්වා කාලංකරොතී'ති—"නවවා දසවා"ති එත්ථ වා සද්දෙ, විකප්පවසෙන "සත්තවා අට්ඨවා එකාදසවා ද්වාදසවා" ති එවමාදීනම්පි සංගහො වෙදිතබ්බො—තත්ථ සත්තමාසජාතො ජීවති සීතුණ්හක්ඛමො පන නහොති අට්ඨමාසජාතො නජීවති සෙසා ජීවන්ති–"ඨිතාවා"තිඨිතාවා හුත්වා මහාමායා'පි දෙවී උපවිජඤ්ඤා කුලඝරං ගමිස්සාමී'ති රඤ්ඤො ආරොචාපෙසි රාජා කපිලවත්ථුතො දෙවදහනගරගාමිමග්ගං අලංකාරාපෙත්වා දෙවිං සුවණ්ණසිවිකාය නිසීදාපෙසි නගරවාසිනො සකලා පරිවාරෙත්වා ගන්ධමාලාදීහි පූජයමානා දෙවිංගහෙත්වා අගමිංසු දෙවදහනගරස්ස අවිදූරෙ ලුම්බිනිසාලවනුය්‍යානං දිස්වා උය්‍යානපරිචරණාය චිත්තං උප්පාදෙත්වා රඤ්ඤො සඤ්ඤං අදාසි රාජා උය්‍යානං පටිජග්ගාපෙත්වා ආරක්ඛං සංවිදහාපෙසි දෙවියා උය්‍යානං පවිට්ඨමත්තාය කායංදුබ්බලං අහොසි අථස්සා මඞ්ගලසාලමූලෙ සිරිසයනං පඤ්ඤපෙත්වා සාණියා පරික්ඛිපිංසු සා අන්තොසාණිං පවිසිත්වා සාලසාඛං හත්ථෙන ගහෙත්වා අට්ඨාසි අථස්සා තාවදෙව ගබ්භවුට්ඨානං අහොසි—"දෙවා පඨමං පතිගණ්හන්ති"ති ඛීණාසවා සුද්ධාවාස බ්‍රහ්මාණො පතිගණ්හන්ති, කථං සූතිවෙසං ගණ්හිත්වා, එකෙකං පන පටික්ඛිපිත්වා ඉදංවුත්තං–තදා බොධිසත්තමාතා සුවණ්ණඛචිතං වත්ථං නිවාසෙත්වා මච්ඡක්ඛිසදිසං දුකූලපට්ටං යාවපාදන්තාව පාරුපිත්වා අට්ඨාසි අථස්සා සල්ලහුකං ගබ්භවුට්ඨානං අහොසි ධම්මකරකතො උදකනික්ඛමනසදිසං–අථ තෙ පකති බ්‍රහ්මවෙසෙනෙව උපසඞ්කමිත්වා පඨමං සුවණ්ණජාලෙන පටිග්ගහෙසුං තෙසං හත්ථතො මනුස්සා දුකූලචුම්බටකෙන පටිග්ගහෙසුං–තෙනවුත්තං "දෙවා පඨමං පතිගණ්හන්ති පච්ඡාමනුස්සාති" "චත්තාරො නං දෙවපුත්තා"ති චත්තාරොමහාරාජානො "පටිග්ගහෙත්වා"ති අජිනප්පවෙණියා පතිගණ්හිත්වා "මහෙසක්ඛො"ති මහාතෙ

ජො මහායසො ලක්ඛණසම්පන්නො "විසදෙව නික්ඛමතී"ති යථා අඤ්ඤෙ සත්තා යොනිමග්ගෙ ලග්ගන්තා භග්ගවිභග්ගා නික්ඛමන්ති න එවං නික්ඛමතී'ති අත්ථො–"උදෙනා"ති උදකෙන කෙනචි අසුචිනා යථා අඤ්ඤෙ සත්තා කම්මජවාතෙහි උද්ධංපාදා අධොසිරා යොනිමග්ගෙ පක්ඛිත්තා සතපොරිසං නරකපපාතං පතන්තාවිය තාලච්ඡිද්දෙන නික්කඩ්ඪියමානා හත්ථිවිය මහාදුක්ඛං අනුභවන්තා නානා අසුචිමක්ඛිතාව නික්ඛමන්ති න එවං බොධිසත්තො. බොධිසත්තං හි කම්මජවාතා උද්ධංපාදං අධොසිරං කාතුං න සක්කොන්ති ඉති සො ධම්මාසනතො ඔතරන්තො ධම්මකථිකොවිය නිස්සෙණියා ඔතරන්තපුරිසොවිය ච ද්වෙ හත්ථෙ ද්වෙ ච පාදෙ පසාරෙත්වා ඨිතකොව මාතුකුච්ඡිසම්භවෙන කෙනචි අසුචිනා අමක්ඛිතොව නික්ඛමති.— "උදකස්සධාරා"ති උදකවට්ටියො තාසු සීතා සුවණ්ණකටාහෙ ඉදච පඨවිතලෙ කෙනචි අසුචිනා අසම්මිස්සං තෙසං පානීයපරිභොජනීය උදකං චෙව අඤ්ඤෙසං සාධාරණං කීළා උදකංච දස්සෙතුං වුත්තං.— අඤ්ඤස්ස පන සුවණ්ණරජතඝටෙහි ආහරිතඋදකස්ස චෙව හංසවට්ටකාදි පොක්ඛරණීගතස්සච උදකස්ස පරිච්ඡෙදො නත්ථි.— "සම්පජානො"ති මුහුත්තජාතො, පාලියං පන මාතුකුච්ඡිතො නික්ඛන්තමත්තොවිය දස්සිතො න එවං දට්ඨබ්බං නික්ඛන්තමත්තං හි නං පඨමං බ්‍රහ්මාණො සුවණ්ණජාලෙන පතිග්ගණ්හිංසු, තෙසං හත්ථතො චත්තාරොමහාරාජානො මඞ්ගලසම්මතාය සුඛසම්ඵස්සාය අජිනප්පවෙනියා තෙසං, හත්ථතො මනුස්සා දුකූලචුම්බටකෙන, මනුස්සානං හත්ථතො මුඤ්චිත්වා පඨවියං පතිට්ඨිතො.— "සෙතම්හිඡත්තෙ අනුධීරමානෙ"ති දිබ්බසෙතච්ඡත්තෙ ධාරියමානම්හි එත්ථච ඡත්තස්ස පරිවාරානි ඛග්ගාදීනි පඤ්චරාජකකුධභණ්ඩානි'පි ආගතානෙව පාලියං පන රාජා ගමනෙ රාජාවිය ඡත්තමෙව වුත්තං තෙසු ඡත්තමෙව පඤ්ඤායති න ඡත්තගාහකා. තථා ඛග්ගතාලවණ්ටමොරහත්ථකවාලවීජනිඋණ්හීසබන්ධා යෙ පඤ්ඤායන්ති න තෙසං ගාහකා සබ්බානි කිර තානි අදිස්සමානරූපා දෙවතා ගණ්හිංසු–වුත්තම්පි චෙතං.

අනෙකසාඛඤ්ච සහස්සමණ්ඩලං
ඡත්තං මරූ ධාරයුං අන්තලික්ඛෙ,
සුවණ්ණදණ්ඩා වීතිපතන්ති චාමරා
න දිස්සරෙ චාමරඡත්තගාහකා'ති.

"සබ්බාච දිසා"ති ඉදං සත්තපදවීතිහාරූපරිඨිතස්ස විය සබ්බදිසානුවිලොකනං වුත්තං න ඛො පනෙතං දට්ඨබ්බං, මහාසත්තොහි මනුස්සානං හත්ථතො මුඤ්චිත්වා පුරත්ථිමං දිසං ඔලොකෙසි අනෙකානි

චක්කවාළසහස්සානි එකඞ්ගනානි අහෙසුං තත්‍ථ දෙවමනුස්සා ගන්ධමා
ලාදීහි පූජයමානා "මහාපුරිස ඉධ තුම්හෙහි සදිසො'පි නත්‍ථි කුතො උ
ත්තරිතරො"ති ආහංසු එවං චතස්සො දිසා ච චතස්සො අනුදිසා ච
හෙට්ඨා උපරී'ති දස'පි දිසා අනුවිලොකෙත්‍වා අත්තනො සදිසං අදිස්වා අයං
උත්තරා දිසා'ති සත්තපදවීතිහාරෙන අගමාසි එවමෙත්‍ථ අත්‍ථො දට්
ඨබ්බො — "ආසභි"න්ති උත්තමං "අග්ගො"ති ගුණෙහි සබ්බපඨමො
ඉතරානි ද්වෙ පදානි එතස්සෙව වෙවචනානි "අයමන්තිමා ජාති නත්‍ථි
දානි පුනබ්භවො"ති පදද්වයෙන ඉමස්මිං අත්තභාවෙ පත්තබ්බං අරහ
ත්තං බ්‍යාකාසි — එත්‍ථ ච සමෙහි පාදෙහි පඨවියං පතිට්ඨානං චතුඉද්ධිපටි
ලාභස්ස පුබ්බනිමිත්තං — උත්තරාභිමුඛභාවො මහාජනං අජ්ඣොත්‍ථරි
ත්‍වා අභිභවිත්‍වා ගමනස්ස පුබ්බනිමිත්තං — සත්තපදගමනං සත්ත
බොජ්ඣඞ්ගරතනපටිලාභස්ස පුබ්බනිමිත්තං — දිබ්බසෙතච්ඡත්තධාර
ණං විමුත්තිච්ඡත්තපටිලාභස්ස පුබ්බනිමිත්තං — පඤ්චරාජකකුධභ
ණ්ඩානි පඤ්චහි'පි විමුත්තීහි විමුච්චනස්ස පුබ්බනිමිත්තං — දිසාවිලො
කනං අනාවරණඤාණපටිලාභස්ස පුබ්බනිමිත්තං — ආසභී වාචාභා
සනං අප්පතිවත්තියධම්මචක්කප්පවත්තනස්ස පුබ්බනිමිත්තං — අ
යමන්තිමා ජාතී'ති සීහනාදො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරි
නිබ්බානස්ස පුබ්බනිමිත්තන්ති වෙදිතබ්බං, ඉමෙ වාරා පන පාලියං ආ
ගතා සම්බහුලවාරො පන අනාගතො ආහරිත්‍වා දීපෙතබ්බො, මහාපුරි
සස්ස හි ජාතදිවසෙ දසසහස්සිලොකධාතුම්හි දෙවතා එකචක්කවාළෙ
සන්නිපතිංසු පඨමං දෙවා පතිග්ගණ්හිංසු පච්ඡා මනුස්සා — තන්තිබද්ධා වී
ණා චම්මබද්ධා භෙරියො ච කෙනචි අවාදිතා සයමෙව වජ්ජිංසු ම
නුස්සානං අන්දුබන්ධනාදීනි ඛණ්ඩා ඛණ්ඩං භිජ්ජිංසු සබ්බරොගා අම්බිලෙ
න ධොත තම්බමලං විය විගච්ඡිංසු ජච්චන්ධා රූපානි පස්සිංසු ජච්ච
බධිරා සද්දං සුණිංසු පීඨසප්පී ජවසම්පන්නා අහෙසුං ජාතිජළාන
ම්පි එළමූගානං සති පට්ඨාසි විදෙසපක්ඛන්තනාවා සුපට්ටනං පාපු
ණිංසු ආකාසට්ඨකභූමට්ඨකරතනානි සකතෙජොභාසෙන භාසිතානි
අහෙසුං වෙරිනො මෙත්තචිත්තං පටිලභිංසු අවීචිම්හි අග්ගි නිබ්බා
යි ලොකන්තරෙ ආලොකො උදපාදි නදීසු ජලං නප්පවත්ති ම
හාසමුද්දෙ මධුරසදිසං උදකං අහොසි වාතො න වායි ආකාසගත
පබ්බතරුක්ඛගතා සකුණා භස්සිත්‍වා පඨවිගතා අහෙසුං චන්දො අති
විරොචි සුරියො න උණ්හො න සීතලො නිම්මලො උතුසම්පන්නො
අහොසි දෙවතා අත්තනො විමානද්වාරෙ ඨත්‍වා අප්ඵොටන සෙළ
න චෙලුක්ඛෙපාදීහි මහාකීළං කීළිංසු චාතුද්දීපිකමහාමෙඝො වස්සි
මහාජනං නෙව ඛුදා න පිපාසා පීළෙසි ද්වාරකවාටානි සයමෙව

විවරිංසු පුප්ඵූපගඵලූපගා රුක්ඛා පුප්ඵඵලානි ගණ්හිංසු — දසස
හස්සිලොකධාතු එකද්ධජමාලා අහොසී'ති තත්‍රා,පිස්ස දසසහස්සිලො
කධාතුකම්පො සබ්බඤ්ඤුතඤ්ඤාණපටිලාභස්ස පුබ්බනිමිත්තං — දෙ
වතානං එකචක්කවාළෙ සන්නිපාතො ධම්මචක්කප්පවත්තනකාලෙ
එකප්පහාරෙන සන්නිපතිත්වා ධම්මං පතිගණ්හනකස්ස පුබ්බනිමිත්තං
පඨමං දෙවතානං පටිග්ගහණං චතුන්නං රූපාවචරජ්ඣානානං පටි
ලාභස්ස පුබ්බනිමිත්තං — පච්ඡා මනුස්සානං පටිග්ගහණං චතුන්නං
අරූපජ්ඣානානං පටිලාභස්ස පුබ්බනිමිත්තං — තන්තිබද්ධවීණානං
සයං වජ්ජනං අනුපුබ්බවිහාරපටිලාභස්ස පුබ්බනිමිත්තං — චම්මබ
ද්ධභෙරීනං වජ්ජනං මහතියා ධම්මභෙරියා අනුස්සාවනස්ස පුබ්බනිමි
ත්තං — අන්දුබන්ධනාදීනං ඡෙදො අස්මිමානසමුච්ඡෙදස්ස පුබ්බනිමි
ත්තං — ජච්චන්ධානං රූපදස්සනං දිබ්බචක්ඛුපටිලාභස්ස පුබ්බනිමි
ත්තං — ජච්චබධිරානං සද්දසවණං දිබ්බසොතධාතුපටිලාභස්ස පු
බ්බනිමිත්තං — පීඨසප්පීනං ජවසම්පදා චතුරිද්ධිපාදවෙගස්ස පුබ්බනි
මිත්තං — ජලානං සති පට්ඨානං චතුසතිපට්ඨානපටිලාභස්ස පුබ්බනි
මිත්තං — අදෙසපක්ඛන්තනාවානං සුපට්ටනං සම්පාපුණනං චතුපටි
සම්භිදාධිගමස්ස පුබ්බනිමිත්තං — රතනානං සකතෙජොභාසොභාසි
තත්තං ලොකස්ස ධම්මොභාසං දීපෙස්සති තස්ස පුබ්බනිමිත්තං —
වෙරීනං මෙත්තචිත්තපටිලාභො චතුබ්‍රහ්මවිහාරපටිලාභස්ස පුබ්බනිමි
ත්තං — අවීචිම්හි අග්ගිනිබ්බානං එකාදස අග්ගිනිබ්බානස්ස පුබ්බනිමි
ත්තං — ලොකන්තරාලොකො අවිජ්ජන්ධකාරං විධමිත්වා ඤාණාලො
කදස්සනස්ස පුබ්බනිමිත්තං — මහාසමුද්දස්ස මධුරතා නිබ්බාණරසෙ
න එකරසභාවස්ස පුබ්බනිමිත්තං — වාතස්ස අවායනං ද්වාසට්ඨිදිට්ඨිග
තභින්දනස්ස පුබ්බනිමිත්තං — සකුණානං පථවිගමනං මහා
ජනස්ස ඔවාදං සුත්වා පාණෙහි සරණගමනස්ස පුබ්බනිමිත්තං —
චන්දස්ස අතිවිරොචනං බහුජනකන්තතාය පුබ්බනිමිත්තං —
— සූරියස්ස උණ්හසීතවිවජ්ජිතඋතුසුඛතා කායිකචෙතසිකසුඛුප්ප
ත්තියා පුබ්බනිමිත්තං — දෙවතානං විමානද්වාරෙසු අප්පොඨනා
දීහි කීළනං බුද්ධභාවං පත්වා උදානං උදානස්ස පුබ්බනිමිත්තං —
චාතුද්දීපිකමහාමෙඝස්ස වස්සනං මහතො ධම්මමෙඝවස්සස්ස පුබ්බ
නිමිත්තං — ඛුදා පිපාසාපීළනස්ස අභාවො කායගතාසතිඅමතපටි
ලාභාය පුබ්බනිමිත්තං — දසසහස්සිලොකධාතුයා එකද්ධජමාල
තා අරියද්ධජමාලාය පුබ්බනිමිත්තන්ති වෙදිතබ්බං — අයං සම්බහු
ලවාරො නාම—එත්ථ පඤ්හ පුච්ඡන්ති—යදා මහාපුරිසො පථවියං ප
තිට්ඨහිත්වා උත්තරාභිමුඛො ගන්ත්වා ආසභිං වාචං භාසි තදා කිං පථවියා

ගතො උදාහු ආකාසෙන දිස්සමානො ගතො උදාහු අදිස්සමානො අචෙලකො ගතො උදාහු අලංකතපටියත්තො දහරො හුත්වා ගතො උදාහු මහල්ලකො පච්ඡාපි කිං තාදිසොව අහොසි උදාහු පන බාලදාරකො'ති? — අයං පන පඤ්හො හෙට්ඨා ලොහපාසාදෙ තිපිටක චූළාභයත්ථෙරෙන විස්සජ්ජිතොව ථෙරො කිරෙත්ථ නියත පුබ්බ කතකම්ම ඉස්සරනිම්මාණවාදවසෙන 'තං බහුං වත්වා අවසානෙ එවං ව්‍යාකාසි-මහාපුරිසො පථවියං ගතො, මහාජනස්ස පන ආකාසෙන ගච්ඡන්තොවිය අහොසි-දිස්සමානො ගතො, මහාජනස්ස පන අදිස්සමානො විය අහොසි-අචෙලකො ගතො, මහාජනස්ස පන අලංකතපටියත්තො විය උපට්ඨාසි — දහරොව ගතො, මහාජනස්ස පන සොළසවස්සුද්දෙසිකො විය අහොසි, පච්ඡා පන බාලදාරකොව අහොසි න තාදිසො'ති-පරිසාවස්ස බුද්ධෙන විය හුත්වා හො ථෙරෙන පඤ්හො කථිතො,ති අත්තමනා අහොසි-ලොකන්තරිකවාරො වුත්තනයො එව — "විදිතා"ති පාකටා හුත්වා යථාහි සාවකා නහානමුඛධොවනපිවනාදිකාලෙ න අතොකාසගතො අතීතෙ සඞ්ඛාරෙ නිප්පදෙසෙ සම්මසිතුං නසක්කොන්ති ඔකාසප්පත්තෙ ඔකාසමත්තමෙව සම්මසන්ති න එවං බුද්ධා බුද්ධාහි සත්තදිවසබ්භන්තරෙ වත්තිත සඞ්ඛාරෙ ආදිතො පට්ඨාය සම්මසිත්වා තිලක්ඛණං ආරොපෙත්වාව විස්සජ්ජෙන්ති තෙසං අවිපස්සිතධම්මො නාම නත්ථි තස්මා "විදිතා"ති ආහ-සෙසං සබ්බත්ථ උත්තානමෙවා'ති —

**අච්ඡරියබ්භූත සුත්තවණ්ණනා**
**නිට්ඨිතා.**

# අච්ඡරියබ්භූත සූත්‍රසන්නය.

—○∘✱∘○—

නමො තස්ස
භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

මෙ, (ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්ස) මාවිසින්; (සකලජනමනඃප්‍රසාදජනකවූ මේ "**අච්ඡරියබ්භූත**" සූත්‍රාන්තධර්මදෙශනාව; එවං සුතං, මෙආකාරයෙන් අසනලද මෙසේ අසනලද මෙසේම අසනලදී;නොහොත්; මෙ, මාගේ; සුතං, ශ්‍රැතිය; එවං' මෙසේමැයි; එකංසමයං, එක්ධර්මදෙශනාසමයෙක්හි; භගවා, (සර්වාන්තර්ය පරිහාර පූර්වඞ්ගම නිරවශෙෂ හිතසුඛවිධාන තත්පර නිරතිශය ප්‍රයොගසම්පත්තියෙන් දෙවිමිනිස්සහිත සත්වලොකයාහට අත්‍යන්තොපකාරකත්වයෙන්) භගවත් නම්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේ; සාවත්ථියං,(රන් රිදී මුතු මැණික් මරකත වෛඩූර්‍ය්‍ය සඞ්ඛ ශිලා ප්‍රවාලාදී නානාවිධ රත්නගණාකීර්ණ විස්ඵූරණ වාණිජොපනශ්‍රෙණීන් සමලඞ්කෘතහෙයින්ද සාලි ව්‍රීහි යව කඞ්ගු කුද්‍රැස වරක ගොධූමය යන සප්තවිධ ධාන්‍යයෙන් සම්පූර්ණහෙයින්ද ක්ෂෞම කොශෙය්‍යාදී පට්ටවස්ත්‍රයෙන්හා අනිකුදු මනුෂ්‍යයන්ට ප්‍රයොජනවත්වූ මධුරාන්නපානවගීතාදිවූ සියළුඋපකරණයෙන් සමෘද්ධහෙයින්ද "**සර්වමස්ති**"කියයුතුතත්හී නෛරුක්තිකවිධියෙන් **ශ්‍රාවස්ති**යයි යන නමින් ප්‍රසිද්ධවූ පුරන්දරපුරාකාර කොශලදෙශතිලකායමාන පැවැත්මේන්යුත්) සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ,(ජෙතනම් රාජකුමාරයාවිසින් රොපිතසංවර්ද්ධිතහෙයින්) ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ,(සියලු අනාථ යාචකජනයන්ට නියමකොට දෙනලද පිණ්ඩපාත දානයන් ඇතිහෙයින් අනාථපිණ්ඩිකනම්වූ සුදත්තාපරනාමධෙයයක් ඇති මහාදානපතිවූ) අනේපිඬු මහසිටානන්විසින් සිවුපණස්කොළක් ධනවියදම්කොට කරවා පිළිගන්වනලද ජෙතවනාරාමයෙහි; විහරති, (වෛනෙයජනයන්ට ධර්මදෙශනාකිරීමෙන්ද නානාප්‍රකාර ඵලසමාපත්තියට සමවැදීමෙන්ද සත්වයන්ටහා තමන්වහන්සේට විවිධවූ හිතසැපඑළවමින්)වැඩවාසය කරවදාරණසේක්.

අථඛො, ඉක්බිත්තෙන්; පච්ඡාභත්තං, පස්බත; හෙවත්,. පස්වරුභාගයෙහි; පිණ්ඩපාතපටික්කන්තානං, පිණ්ඩපාතයෙන් වැලක්කාවූ; හෙවත්, (ගොචරග්‍රාමයෙන් පිඬුසිඟාගෙණවුත් නිස්සරණධ්‍යාශයෙන්යුක්තව) වළඳා ඉක්බිතිවූ; උපට්ඨානසාලායං, සන්නිපතිත ශාලාවෙහි; සන්නිපතිතානං, රැස්ව; සන්නිසින්නානං, හුන්නාවූ; ස

ම්බහුලානං භික්ඛූනං, බොහෝ භික්ෂූන්ට; අයමන්තරා කථා, (උද්දෙස ප්‍රතිපුච්ඡාදිවශයෙන් සද්ධර්මනිශ්‍රිතවූ). මේ කථාතොමෝ; උදපාදි, පහළවූවාය; කෙසේද?

ආවුසො, ඇවැත්නි; (තථාගතස්ස, තථාගතත්වාදී කාරණයෙන් යුක්තවූ) සර්වඥයාගේ; මහිද්ධිකතා, මහත්සෘද්ධිඇතිබව; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යමත්වන්නේය; අබ්භුතං, (පෙරඅවිච්ජිනානව නොපැවතිහෙයින්) අද්භූතය; ආවුසො, ඇවැත්නි; තථාගතස්ස, (යටින්අවීචියපටන් උඩින් භවාග්‍රයපරියන්තකොටඇති අනන්තාපර්‍ය්‍යන්ත ලොකධාතුව දිව්‍යමනුෂ්‍යයන්සහිතවූ සකලලොකය අභිභවනාර්ථයෙන් තථාගතනම්වූ) සර්වඥයාගේ; මහානුභාවතා,(සකලසත්වයන්ටඅධිපතිවූ වසවර්ත්මරහු තමා සිරිපාමුල හෙලා තෙජස් නැතිකොට යවන්ට සමර්ථවූ)මහත් ආනුභාවඇතිබව; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යමත්වන්නේය; අබ්භුතං; (අවසෙසදිව්‍යමනුෂ්‍යයන්කෙරෙහි අවිද්‍යමානහෙයින්)පෙරනුවූදෙයක; යත්‍රහි නාම,(**යත්‍රනාම**යනුආශ්චර්‍ය්‍යාර්ථයෙහි නිපාතමාත්‍රයෙකි; නොහොත්, යත්‍රහිනාම තථාගතො, ඒතථාගතොත්තමවූ දිපදෙත්තම සර්වඥතෙම; අතීතෙ, අතීතකාලයෙහි; නොහොත්, අතීතෙ, ඉක්මගියාවූ; පරිනිබ්බුතෙ, (කෙලශපරිනිර්වාණය, ස්කන්ධපරිනිර්වාණය, ධාතුපරිනිර්වාණය, යන ත්‍රිවිධාකාරයෙන්)පිරිනිවියාවූ; ඡින්නපපඤ්චෙ,(තෘෂ්ණා මාන දෘෂ්ටි සංඛ්‍යාත ත්‍රිවිධවූපපඤ්චයන් නැවත නූපදනාපරිද්දෙන් තමන්වහන්සේවිසින්ම මූලොච්ඡින්නකළහෙයින්)සිඳිනාලද පපඤ්චයන්ඇත්තාවූ; ඡින්නවටුමෙ, (කාම රූපාරූප සඞ්ඛ්‍යාත භවත්‍රයෙහි සඤ්චරණයට කාරණවූ කුසලාකුසලකර්මවට්ටසඞ්ඛ්‍යාත) මුල්සිඳිනාලද වටුමයන්ඇත්තාවූ; පරියාදින්නවට්ටෙ, පුනරුත්පත්තිනැතිව පිරිසිඳ හරණලද කර්මපථඇත්තාවූ; සබ්බදුක්ඛවීතිවත්තෙ, සියළුවිපාකවර්ත සඞ්ඛ්‍යාත ජාතිජරාමරණාදී දුක්අතික්‍රාන්තකළාවූ; බුද්ධෙ,(භූත භවිෂ්‍යත් වර්තමාන සඞ්ඛ්‍යාත කාලත්‍රයවර්ති සර්වධර්මයන් සර්වාකාරයෙන් පරොපදෙසරහිතව ස්වයම්භූඥාණයෙන් දත්තාවූ) සර්වඥවරයන්; ජානිස්සන්ති, (හස්තාමලකයක්සේ සර්වප්‍රකාරයෙන්) දැනගත්සේක;(මෙහි **ජානිස්සන්ති** යනු යත්‍රහි නාම යන නිපාතවශයෙන් අනාගතවචනය–අර්ථයවනානි අතීතවන්නේය)ආවුසො,ඇවැත්නි; අච්ඡරියං,(එසේ දැනීම දිව්‍යමනුෂ්‍යයන්සහිත අවසෙස සත්වයන්ට නොහැකිවනහෙයින්) ඉතාආශ්චර්‍ය්‍යවන්නේය; අබ්භුතං, පෙරනුවූදෙයක; තෙ භගවන්තො, භග්නකරණලද රාගාද්‍යර්ථයන්ඇතිහෙයින් භගවත්නම්වූ)ඒසර්වඥවරයෝ; එවං ජච්චා අහෙසුං, මෙබඳු කාලයක මෙබඳු උත්පත්තියක් ඇත්තාහුයයිකියා; ජානිස්සන්ති, දැනගත්සේක; ඉතිපි

අච්ඡරියං, ශම්භාරණියද ආශ්චර්‍යයීවත්තෝය,-පෙ-තෙ භගවන්තො (ඓශ්වර්‍ය්‍යශ්‍රී පුණ්‍ය යශශ්‍රීසංකල්පසිද්ධිප්‍රයත්නායත්න ෂාඩ්ගුණ්‍යයෙන් පරිපූර්ණහෙයින් භගවත්නම්වූ )ඒ සර්වඥවරයෝ; එවං නාමා අහෙසුං, (කාශ්‍යපය, කොණාගමණය, කකුසඳය, වෙස්සභූය, සිඛිය, විපස්සිය, දීපඞ්කරය, කොණ්ඩඤ්ඤය, මඞ්ගලය, යනාදී )මෙබඳු මෙබඳු නම්ඇත්තාහුයයි කියා; ජානිස්සති-පෙ-තෙ භගවන්තො, (කුසලාදීධර්මයන් විභාගකළහෙයින් භගවත්නම්වූ )ඒසර්වඥවරයෝ; එවං ගොත්තා අහෙසුං, (කාශ්‍යපගොත්‍රය කොණ්ඩඤ්ඤගොත්‍රය ගෞතමගොත්‍රය යනාදීවශයෙන්)මෙබඳු මෙබඳු ගොත්‍රයන්ඇත්තාහුයයි කියා; ජානිස්සති,-පෙ-තෙ භගවන්තො, (දිව්‍යබ්‍රහ්මාර්‍ය්‍යවිහාර කායවිවෙකාපධිවිවෙක සූන්‍යතාප්‍රණිහිතානිමිත්තාවිමොක්ෂ ප්‍රඥාභිඥාදීවූ ලෞකික ලොකොත්තර මනුෂ්‍යධර්මයන් භජනයකළහෙයින් භගවත්නම්වූ) ඒසර්වඥවරයෝ; එවං සීලා අහෙසුං, (චතුපාරිශුද්ධිශීල මාර්ගඵලසඞ්ඛ්‍යාතවූ ලෞකිකලොකොත්තරවශයෙන්) මෙබඳු මෙබඳු ශීලයන්ඇත්තාහුයයිකියා; ජානිස්සති, -පෙ- තෙ භගවන්තො, (ලෞකික ලොකොත්තර හිතසුඛාභිනිර්වර්තක දානසීලාදී පාරප්‍රාප්ත භාග්‍යයෙන් යුක්තහෙයින් භගවත්නම්වූ) ඒසර්වඥවරයෝ; එවං ධම්මා අහෙසුං, (සමාධිසඞ්ඛ්‍යාත ලෞකික ලොකොත්තරවශයෙන්) මෙබඳු මෙබඳු සමාධියක් ඇත්තාහුයයිකියා; ජානිස්සති,-පෙ-තෙ භගවන්තො, (කාමරූපාරූපසඞ්ඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමණ අර්හත්මාර්ගඥානමුඛයෙන් වාන්තකළහෙයින් භගවත්නම්වූ)ඒසර්වඥවරයෝ; එවං පුඤ්ඤා අහෙසුං, * (ලෞකිකලොකොත්තරවශයෙන්)මෙබඳු මෙබඳු කුසලයක්ඇත්තාහුයයිකියා; ජානිස්සති,-පෙ-තෙ භගවන්තො, (කුසලාදීධර්මයන්ගේ පඤ්චස්කන්ධ ද්වාදශායතන අෂ්ටාදශධාතු චතුස්සත්‍යද්වාවිංශතීන්ද්‍රියද්වාදශාඞ්ගප්‍රතීත්‍යසමුත්පාදචතුස්මෘතිප්‍රස්ථාන සම්‍යක්ප්‍රධානාදීවශයෙන් විභාගකළහෙයින්) භගවත්නම්වූ ඒසර්වඥවරයෝ; එවං පඤ්ඤා අහෙසුං,(ලෞකිකඥානසඞ්ඛ්‍යාත සර්වඥතාඥානයහා ලොකොත්තරඥානසඞ්ඛ්‍යාතවූ ආශ්‍රවක්ෂයකරාභිඥානයහා ලෞකිකලොකොත්තරවශයෙන්) මෙබඳු මෙබඳු ප්‍රඥාවක්ඇතිවූවාහුයයිකියා; ජානිස්සති,-පෙ-තෙ භගවන්තො, (සකලක්ලේශයන් භග්නකොට නිරුත්තරවූසම්‍යක්සම්බෝධියට පැමිණිහෙයින්)භගවත්නම්වූ ඒසර්වඥවරයෝ; එවං විහාරී අහෙසුං, මෙබඳු නිරොධඵලසමාපත්ති විහරණයක් ඇත්තාහුයයිකියා; ජානිස්සති,-පෙ-තෙ භගවන්තො, (දිව්‍යබ්‍රහ්මනාගසුපර්ණගරුඩගන්ධර්වසිද්ධවිද්‍යාධරාදීන්විසින්

* "එවං පුඤ්ඤා අහෙසුං" යි පෙළඅටුවාහි නොපෑනේ.

කරණලබන උදාරතර ප්‍රත්‍යයප්‍රතිපත්ති පූජාවට යොග්‍යවූ භාග්‍යඇති හෙයින්)භාග්‍යවත්නම්වූ ඒසර්‍වඥවරයෝ; එවං විමුත්තා අහෙසුං, (තමන්වහන්සේවිසින් මැඩපවත්වනලද නීවරණාදීන්කෙරෙන් විමුක්තවූබැවින් විෂ්කම්භනවිමුක්තිසඞ්ඛ්‍යාත අෂ්ටසමාපත්තීහුද ඒඒඅනුපස්සනාවන්ට ප්‍රත්‍යනීකාඞ්ගවශයෙන් තමන්විසින්හරණලද ක්ලෙශයන්කෙරෙන්විමුක්තහෙයින් සමුච්ඡෙදවිමුක්තිසඞ්ඛ්‍යාතවූ නිර්‍වාණයදයන මේපඤ්චවිධ විමුක්තිවශයෙන්)මෙබඳුමෙබඳු විමුක්තියක් ඇත්තාහුයයි කියා; ජානිස්සති, දැනගත්සේක; ඉතිපි අච්ඡරියං, මේකාරණයද ආශ්චර්‍ය්‍යවන්නේය; අබ්භුතං, අද්භූතවන්නේය.

එවං වුත්තෙ, ඒභික්ෂූන්විසින් මෙසේකියනකල්හි; ආයස්මා ආනන්දො, ආයුෂ්මත්ආනන්දස්ථවිරයන්වහන්සේ; තෙ භික්ඛූ, (ක්ලේශභින්නපට ධරණාර්ථයෙන්හා සංසාරභයදර්ශිනාර්ථයෙන් භික්ෂුනම්වූ) ඒ සඟහට; එතදවොච, මෙසේවදාළසේක;—ආවුසො, ඇවැත්නි; තථාගතා, (සියළු රූපාරූපධර්මයන්ගේ තත්ලක්ෂණ සාමාන්‍යලක්ෂණවශයෙන්දැන ඤාණගතියෙන් අවිරුද්ධවආවාවූ) සර්‍වඥවරයෝ;අච්ඡරියාචෙව, ආශ්චර්‍ය්‍යවූවාහුය; අච්ඡරියධම්ම සමන්නාගතා ච, ආශ්චර්‍ය්‍යධර්මයෙන්ද සමන්විතවූවාහුය; ආවුසො, ඇවැත්නි; තථාගතා, (තථාධර්මයයි කියනලද චතුරාර්‍ය්‍යසත්‍යයන් තත්වූපරිද්දෙන් මනාකොට දත්හෙයින් තථාගතනම්වූ) ඒ සර්‍වඥවරයෝ; අබ්භුතාචෙව, අද්භූතවූවාහුය; අබ්භුතධම්මසමන්නාගතාච, අද්භූතධර්මයෙන්ද සමන්විතවූවාහුය; (ඒ එසේමැයි;) අයච, මෙසිඳු; තෙසං භික්ඛූනං, ඒභික්ෂූන්ට; අන්තරාකථා, (උද්දෙස ප්‍රතිපුච්ඡාවශයෙන් සඞ්ධර්මනිශ්‍රිතවූ) අන්තරකථාතොමෝ; විප්පකතා හොති, කොට අඩාලවූයේය; හෙවත්, පරිසමාප්තවූයේය; අථ, එකල්හි; භගවා, භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; සායණ්හසමයං, සවස්වේලෙහි; පතිසල්ලානා වුට්ඨිතො, සමාපත්තින්නැගී වැඩසිටිසේක්; උපට්ඨානසාලා, උපස්ථානශාලාතොමෝ; යෙන, යම්තැනෙක්හිද; තෙන එතන්හි; උපසඞ්කමි, වැඩිසේක; උපසඞ්කමිත්වා, වැඩ; පඤ්ඤත්තෙ ආසනෙ, පනවනලද බුද්ධාසන මස්තකයෙහි; නිසීදි, (යුගන්ධරමුදුනෙහි දිලියෙන ළහිරුමඬලක්සේ සවණක්රැසින් දිලියෙමින්) වැඩහුන්සේක්; නිසජ්ජ ඛො, වැඩහුන්නාවූ; භගවා, භාග්‍යවත්තෙම; භික්ඛවෙ, මහණෙනි; එතරහි, දැන්මෙතැන්හි; කායනු කථාය, කවර නම් කථාවකින් යුක්තව; සන්නිසින්නා අත්ථ, හුන්නාහුවෙද්ද; වො, තොපට; කාචපන කථා, කවරනම් කථාවක්; අන්තරා, අතුරෙහි; විප්පකතා'ති, කොට අඩාළවීදැයි; භික්ඛූ, භික්ෂූන්ට; ආමන්තෙසි, අඬගා වදාළසේක.

භන්තෙ, ස්වාමීන්වහන්ස; ඉධ, මෙතැන්හි; පච්ඡාභත්තං, පස්බත;-පෙ-සන්නිසින්නානං, හුන්නාවූ; අම්හාකං, අපට; අයමන්තරා, කථා, මේ අතුරුකථාතොමෝ; උදපාදි, පහළවූයේය; කෙසේදයත්?-පෙ-එවං වුත්තෙ, මෙසේ කීකල්හි; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ; අමෙහ, අපට; එතදවොච, මෙසේකීසේක; ආවුසො, ඇවැත්නි; තථාගතා-පෙ-අයං බො කථා, මේකථාතොමෝ; භන්තෙ, ස්වාමීන්වහන්ස; නො, අපට; අන්තරා, අතුරෙහි; විප්පකතා, කොට අඩාලවී; අථ, එකල්හී; භගවා, භාග්‍යවත්තෙම; අනුප්පත්තො'ති, පැමිණිසේකැයි දූන්වූහ; අථඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවත්තෙම; ආයස්මන්තං ආනන්දං, ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්වහන්සේට; ආමන්තෙසි, ආමන්ත්‍රණයකොට වදාළසේක; ආනන්ද, ආනන්දස්ථවිරය; තං, තෝ; තසමාතිහ, (යම්හෙයකින් සර්වඥවරයෝ අශ්චර්යඅද්භූතධර්මයන් ඇත්තාහුයයි කියෙහිවේද) එබැවින්, තං, ඒකාරණය; භීය්‍යොසොමත්තාය, බොහෝසේ (නැවත නැවත සතුටුවීමපිණිස වන්නේය); තථාගතස්ස, තථාගතවූසර්වඥයාගේ; අච්ඡරියා, ආශ්චර්යමත්වූ; අබ්භූත ධම්මා, අද්භූත ධර්මයෝ; පටිභන්තු'ති, වැටහෙත්වයි; හෙවත්, තත්වූපරිද්දෙන් ප්‍රකාශවෙත්වයි වදාළසේක.

ආනන්ද, ආනන්දය; තුසිතං කායං, පශ්චිමභවිකවූ සියළුබෝසත්නට නිවාසවූ තුසීදිව්‍යලොකයෙහි; උප්පජ්ජමානො, උපදනාවූ; බොධිසත්තො, බොධිසත්වතෙම; සතො සම්පජානො, (මිනිස්ලොවින් සැව තුසීදිව්‍යලොකයෙහි උපදිමියි) නොමුළාව සිහියෙන්යෙදී ප්‍රත්‍යක්ෂයෙන්ම දැන; උප්පජ්ජතී'ති, උපදනාසේකැයියන; එතං, මේකාරණය; භන්තෙ, ස්වාමීන්වහන්ස, භගවතො සම්මුඛා, භාග්‍යවතුන්වහන්සේගේ සම්මුඛයෙන්; මෙ, මාවිසින්; සුතං, අසනලද්දේය; භගවතො සම්මුඛා, භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙන්; පටිග්ගහිතං, මාවිසින් පිළිගන්නාලද්දේය; භන්තෙ-පෙ-ලොකයෙහි; උප්පජ්ජි, උපන්සේකැයියන; යම්පි, යමෙක්ඇද්ද; භන්තෙ, වහන්ස; ඉදම්පි, මේකාරණයද; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; අච්ඡරියං, ආශ්චර්යමත්වූ; අබ්භූතංධම්මං, අද්භූත ධර්මයකැයිකියා, අහං, මම; ධාරෙමි, ධරමි; (හෙවත් අපගේ ශ්‍රීමහා බෝසතානෝ වෙස්සන්තරාත්මවන් ජාතියෙහි 'ජූජක' නම් බමුණට දරුදෙදෙනා දන්දී දෙවනදවස් ශක්‍රයා බමුණුවෙස් ගෙණවුත් ඉදිරියෙහි සිට මම මහල්ලෙමි හැල්කා විඩාව ගියෙමි නුඹ බුදුසිරිකත පතානම් තෙල 'මද්‍රී' දේවි මටදෙවයි ඉල්ලූකල දෙබසක් නොසිතාම දේවීන් අත

අල්වා ඔහුඅත තබාදීඑකොණෙහි සතුටුවූ සක්දෙව්රජහුවිසින් දෙනල
ද අටවරයන් ගන්නාසේක් මෙයින්සැව තුසීදිව්‍යලොකයෙහි මාගේ පි
ළිසිඳීමවේවයිනියා වරයක් ගත්සේක එතැන්පටන් තුසීභවනයෙහි උ
පදිම්කියා දන්නාසේක මේමිනිස්ලොවදී දූන්වීමය එයින් චුතව තුසී
දිව්‍යලොකයෙහි ඉපිද මේදෙව්ලොව උපනිම්යි කියා දැනගත්සේක
මේදෙව්ලොවදී දූනිමය-මෙසේ සෙසුදෙවියෝ නොදන්නාහුදූයි යත
හොත්-නොදන්නාහුනොවෙති ඒදෙවතාවෝ වනාහී උද්‍යානවිමාන්
කල්පවෘක්ෂයන් දැක දිව්‍යනාටකයන් පසතුරුනාදයෙන් ප්‍රබොධකර
වනලද්දාහු පින්වත තෙපි මිනිස්ලොවින්චුත ව අවුත් මෙහි උපන්නා
හුයයි සිහිකරවනලද්දාහුම දනිති බෝසතානෝවනාහි චුතවනකල
ප්‍රථමජවනවාරයෙහි නොදන්නාසේක දෙවෙනිජවනවිත්‍තවාරය ප
ටන් දන්නාසේක මේකාරණය බුදුන්ගේ සම්මුඛයෙහිදී මාවිසින් අස
නලද්දේය· එබැවින් උක්තප්‍රකාරවූ මේකාරණයවනාහී අවසෙස ස
ත්‍වයන්ට අසාධාරණහෙයින් මාගේ බුදුන්ගේ අශ්චර්‍ය්‍යඅද්භූත ධර්‍මය
කැයිකියා) සලකම්.

ආනන්ද, ආනන්දය; බොධිසත්තො, බෝසත්තෙම; සතො සම්ප
ජානො, සිහියෙන්යෙදී මේදෙව්ලොව වෙසෙම්යිකියාදැන; තුසිතෙ
කායෙ, තුසීදිව්‍යලොකයෙහි; අඨාසී'ති, සිටිසේකැයියන; එතං;
මේ කාරණය;—පෙ—ධාරෙමි, සලකම්;—(මෙහි දෙව්ලොව වෙසෙ
මියි කියා මහබෝසතානෝම දන්නාබවවූහ් සෙස්සෝ නොදන්
නාහුදූයි යතහොත් ? නොදන්නාහු නොවෙති චක්‍ෂුරාදී සඳෙර උපදි
නා බලවත් ඉෂ්ටාරම්මණයෙන් තුමූ මැඩපවත්වනුලබන්නාහු සිහිය
හැර මුළාව තමාකිපිබවත් නොදන්වා ආහාරූපච්ජෙදයෙන් ක්‍ෂුධායෙ
න් මිරිකී රත්වූගල්පිට තුබූ මහනෙල්මලක් පැන්කලසියයකින් තෙ
මුවත් මැලවීයන්නාසේ කරජකය සුකුමාලබැවින් හා ජඨරාග්නිය බල
වත්හෙයින් කාලක්‍රියාකෙරෙති බෝසත්හට එබඳුවූ ආරම්මණයෙක්
නැද්දයත්? නැත්තේනොවෙයි ඒබෝසත් වනාහි ආයු වර්‍ණාදී දශකා
රණයකින් සෙස්සත්වයන්ට වඩා අධිකවෙයි රූපශබ්දාදියෙහි පවත්නා බ
ලවත් ආරම්මණයෙන් තමා මැඩගතනොහැකිවෙයි මහබෝසතානෝ
ම ඒ අරමුණ මැඩපවත්වා සිහියෙන්යෙදී දෙව්ලොව වැඩසිටිසේකැ
යිකියා මේකාරණය බුදුන් අභිමුඛයෙහිදී මාවිසින් අසනලද්දේය–
එබැවින් මේකාරණයද ආශ්චර්‍ය්‍යඅද්භූතවන්නේය.)

ආනන්ද,–පෙ–තුසීදිව්‍යනිකායෙහි; යාවතායුකං, ආයුෂය යම්තාක්ද
ඒතාක්කල්;(හෙවත්, සත්පණස්කොළසැටලක්‍ෂයක් හවුරුදු මුළුල්ලෙ
හි) අඨා'සීති,සිටිසේකැයියන;එතං,–පෙ–ධාරෙමි, ධරම්; හෙවත්,සල

කම්–(කිමෙක්ද?මහබෝසතාණෝ පශ්චිමභවයට පැමිණමුත් සෙසුඅත් බැව්හි දෙව්ලොව ආයුපමණින් නොසිටිනාසේක්දයත්? එසේ නොසිටිනාහ අනිත්දවසෙක දීර්ඝායුෂ්ක දෙව්ලොව උපන්නෝවේද එහිසිට පාරමිතාපිරීම නොහැක්කැයි සිතා ඇස්පියා අධිමුක්තිකාලක්‍රියායෙන් මිය මිනිස්ලොව උපදිනාසේක මෙසේ අධිමුක්තිකාලක්‍රියා කිරීම බෝසතුන්ටමුත් සෙස්සන්ට නැත්තේමය පශ්චිමජාතියෙහි උපන් බෝසත්වනාහි නුදුන් දානයකුත් නොරැකි ශීලයකුත් නොපිරූ පාරමිතාවකුත් නැත්තේය සියලුපාරමිතාවන්ම පිරූහෙයින් මහබෝසතාණෝ ඒදෙව්ලොව ආයුපමණින්ම වැඩසිටිසේක–මේ කාරණයද ආශ්චර්ය අද්භූතවන්නේය.)

ආනන්ද,–පෙ–තුසිතා කායා,තුසිදිව්‍යනිකායෙන්; චවිත්වා, චුතව;සතො සම්පජානො, සිහියෙන් යෙදී මව්කුසට එලඹෙමියි දැන; මාතුකුච්ඡිං, මව්කුසට; ඔක්කමිති;එලඹුනුසේකැයි යන;එතං, මේ කාරණය;–පෙ–සලකම්–(මෙහි අප මහබෝසතාණෝ සියලුපාරමිතාවන් පුරා ඒදිව්‍යලොකයෙහි වැඩසිටිසේක දෙවියන්ට මරණාසන්නකාලයෙහි මනුෂ්‍යගණනින් සත්දවසක් තබා මරණයට පූර්වනිමිති පසක් පහළවෙයි, හේ කවරේදයත්? උපන්තැන්පටන් දෙවියන්ට සීතොෂ්ණාදී පීඩාවෙක්නැත මරණාසන්නකාලයෙහි සකලශරීරයෙන් බින්දුබින්දුවශයෙන් ඩා සෙලවෙයි, තවද දත්වැටීම් හිස් නරවීම් ඇඟ රැලිනැගීම්වශයෙන් ශරීරවෛවර්ණ්‍යයක් කිසිකලෙකත් නැත්තේය දිව්‍යස්ත්‍රීහු සොළොස් හැවිරිදිස්ත්‍රීන් වැනිවෙයි දිව්‍යපුත්‍රයෝ විසිවයස් පිරුණුවූවන්සේ වැටහෙයි මරණාසන්නකාලයෙහි සකලශරීරය දුර්වර්ණව කලාන්තස්වරූප ඇතිවෙයි විමාන සයනාදියෙහි විසීමට රිසි නැතිවෙයි, උපන්තැන්පටන් සත්පණස්කෙළ සැටලක්ෂයක් හවුරුදු පරනොවතුබූ පැළඳි මල් පරවයෙයි, එසේම හන්සළු කිළුටුවෙයි; මෙකී පූර්වනිමිති අල්පෙශාක්‍ය දෙවියන්ට පහළනොවෙයි– යම්සේ මිනිස්ලෝව මහාපින්වත් රාජරාජමහාමාත්‍යාදීන්ට උල්කාපාත භූමිකම්පා චන්ද්‍රග්‍රහණාදිවශයෙන් ඉෂ්ටානිෂ්ට පූර්වනිමිති පහළවේද සියල්ලවුන්ටම පහළනොවේද එමෙන් මහෙශාක්‍ය දෙවියන්ටම මේපූර්වනිමිති පහළවන්නේය– තවද මනුෂ්‍යයන් අතරෙහි උල්කාපාත භූමිකම්පාදී කාරණයන් නක්ෂත්‍රපාඨකයෝම දනිත්ද එමෙන් දෙවියන් අතුරෙහිද පණ්ඩිතවූ පින්වත් දෙවතාවෝම දනිත්මය සෙස්සෝ නොදනිත්මය ස්වල්පකුසලයෙන් දෙව්ලොව උපන් දෙවතාවෝ පචපූර්වනිමිති පහළවූකල කව්රු දනිද්ද කුමකැයි කියාභයවෙති, පින්වත් දෙවතාවෝ පෙර අපි බොහෝ කුසල් කළම්හ මතුමත්තෙහිත් දෙව්ලෝ උපදුම්හයි භයනොවෙති

මහ බෝසතාණෝ චනාහි මේ පස්පූර්වනිමිති පහළවූකල මතුජාති
යෙහි බුදුව සූවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් භවකාන්තාරයෙන් එත
රකොරෙමියි යන උදාරතරාධ්‍යාශයෙන් භයනොවූසේක- එකල දශ
දහසක් සක්වල දෙවිබඹුන්ගේ ආරාධනාවෙන් පස්බැලුම්බලා මහ
බෝසතාණෝ මවුකුසට එළඹෙමියි දැන සිහියෙන්ම මවුකුස පිළි
සුන්සේකැයිකියා බුදුන්සම්පයෙහිදී මාවිසින් අසනලද්දේය- එබැවි
න් මේකාරණයද ආශ්චර්‍ය්‍ය අද්භූත වන්නේයයිකියා සලකම්.)

ආනන්ද, ආනන්දය; යදා, යම්කලෙක්හී; බොධිසත්තො, බොධි
සත්වතෙම; තුසිතා කායා, තුසිත දිව්‍යලොකයෙන්; චවිත්වා, චුත
ව; මාතුකුච්ඡිං, මවුකුසට; ඔක්කමි, එළඹුනුසේක්ද; අථ, එකල්හී;
(මේ මතුකියන කාරණයන්;) සදෙවකෙ, දෙවියන් සහිතවූ;
සමාරකෙ, මරුන් සහිතවූ; සබ්‍රහ්මකෙ, බඹුන් සහිතවූ; ලොකෙ,
ලොකයෙහි; සස්සමණබ්‍රාහ්මණියා, ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිතවූ; ස
දෙව මනුස්සාය, සියලු දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ; පජාය, සත්වය
න්අතුරෙහි; දෙවානං, දෙවියන්ගේ; දෙවානුභාවං, දිව්‍යානුභාව
ය; අතික්කම්ම, ඉක්ම; අප්පමාණො, ප්‍රමාණාතික්‍රාන්තවූ; උළාරො
ඔභාසො, මහත්වූ ආලොකය; පාතු භවති, ප්‍රාදුර්භූතවන්නේය; ය
ත්‍ථ'පි යම්තැනෙක්හී; අඝා, (හැමකල්හිම) විවෘතවූ; අසංවුතා,
(යටින් ක්ෂාරවූ ජලපොළවහා උඩින් අජටාකාශයහා වටින් ච
ක්‍රවාටපර්වතයමුත් අතික්) සංවරයක් නැත්තාවූ; අන්ධකාරා, ඝණ
න්ධකාරයෙන් ගැවසීගත්තාවූ; අන්ධකාර තිමිසා, (චක්‍ෂුශප්‍රසාදයට
ගොචරවූ රූපයන් නොපෙනෙනහෙයින්) චක්‍ෂුර්විඥානය නූ
පදනාවූ; යා'පි තා ලොකන්තරිකා, (චක්‍රවාටයන් තුණක්තුණක්පාසා
අන්තරන්තරයෙහි පිහිටියාවූ දහසක් යොදුම් පමණ ඇති)
යම් ඒ ලොකාන්තරිකනම් නරකසමූහයෙක් ඇද්ද; එවං මහිද්ධි
කා, (එකපැහැර තුන්දිවයිනෙක පෙනී ආලොක පතුරුවනතර
ම්) මෙසේ මහත්සෘද්ධිමහිම ඇත්තාවූ; එවං මහානුභාවා, (එකිඑ
කී දිශාවෙන් නවදහසක් නවදහසක් යොදුන් අන්ධකාරවිධ්වංශ
නයකොට අළුකරණතරම්) මෙසේ මහත් ආනුභාව ඇත්තාවූ; ඉමෙ
චන්දිමසුරියා, මේ චන්ද්‍රසූර්‍ය්‍යයෝදෙදෙනා; ආභාය, තමන්ගේආලොක
යෙන්; නානු භොන්ති, අළුකරන්නට නොපොහොසත්වෙද්ද; (ඒ
හෙයින්) දෙවානං, එබඳුදෙවියන්ගේ; දෙවානුභාවං, දිව්‍යානුභා
වය; අතික්කම්මෙව, ඉක්මවාම; තත්‍ථ'පි, ඒලොකාන්තරිකයෙහිද;
අප්පමාණො, ප්‍රමාණාතික්‍රාන්තවූ; උළාරො ඔභාසො, මහත්වූ ආ
ලොකය; පාතුභවති, පහළවූයේය; තත්‍ථ'පි, ඒලොකාන්තරිකයෙහි
ද; උප්පන්නා, (මවුපියන්ටහා ශ්‍රමණබ්‍රාහ්මණයන්ට අනාදරකිරීමහා

ප්‍රාණඝාතාදී බලවත්පව්කොට) උපන්නාවූ; යෙ සත්තා, යම්ස
ත්වකොණෙක්ඇද්ද; තෙ'පි, ඒප්‍රෙතයෝද; භො,පින්වත්නි; ඉධූපප
න්නා, මෙහිඋපන්නාවූ; අඤ්ඤෙ'පි කිර සත්තා, අනිකුදු සත්වයෝ
වනාහි; සන්ති, ඇත්තාහුයසිකියා; තෙනොභාසෙන, ඒආලොක
යෙන්; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; සඤ්ජානන්ති, දන්නාහුය; අ
යච දසසහස්සී ලොකධාතු, මේ දශසහශ්‍රී ලොකධාතුතොම; සංක
ම්පති, කම්පාවන්නීය; සම්පකම්පති, විසෙසයෙන්කම්පාවන්නීය;
සම්පවෙධති,·භ්‍රමවන්නීය; දෙවානං, දෙවියන්ගේ;–පෙ–පාතුබ්භව
තී'ති, ප්‍රාතුර්භූතවියසියන; එතං, මෙකාරණය;–පෙ–සඞ්කම්.–(හෙව
ත් යම්කලෙක බෝසතානෝ තුසීදෙව්ලොවින් චුතව මවුකුසට
එලඹිසේක්ද එකල චන්ද්‍රසූර්‍ය්‍යාලොකයහා ආනුභාව අභිභවනයකො
ට අප්‍රමාණ ආලොකය පහළවූයේය දියපිට පාත්‍රයෙන් පාත්‍රය පැ
හැරසිටිනා ලෙස තුබූ පාත්‍රාස හයක්සේ අනන්තාපරිමාණ සක්වළ
සාරලක්‍ෂ අසූදහසක් යොදුන් ගැඹුරඇති ජලපොළව පිට සක්
වළගලින් සක්වළගල පැහැර පිහිටියේය සක්වළගල් තුණක් එ
ක්වූඅතර අටදහසකදමණ යොදුන් තැන එකිඑකි ලොකාන්තරි
ක නරකයක් බැගින් අනන්තවූ ලොකාන්තරික නරකසමූහය පි
හිටියේය එහි උඩින් අජටාකාශයහා යටින් ජලපොළවහා වටින
චක්‍රවාටයන්තුණවිනා අනික් ආවරණයක් නැත චක්‍ෂුර්විඥානය
නූපදවන්නාවූ ඝණාන්ධකාරයෙන් ගැවසීගත්තේය තුන්දිවයිනෙක
පෙනියන්තරම් මහත් සෘද්ධිමහිමයක්හා නවදහසක් යොදුන් අ
න්ධකාර විධ්වංශනයකොට ආලොක කරන්නාවූ සමර්ථවූ මහානුභාව
සම්පන්න චන්ද්‍රසූර්‍ය්‍යදෙදෙනාවිසිනුදු ආලොකකිරීමට නොපො
හොසත්වන්නේය ඒ කුමක්නිසාදයත්?ඒ හිරු සඳු වනාහී සක්
වළගල වටම ගැසිරෙන්නාහුය ලොකාන්තරික නරකයෝ සක්ව
ළගලින් පිටත වූහ එබැවින් ආලොක පතුරුවන්ට නොහැකි
මෙති එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් උසඇති මහමෙරසා ප
ඝන්ව ටියක් කොට සවාසූදහසක් ගැඹුරුවූ සාගරජලයසා තෙ
ල්වත්කොට පහන්දැල්වූයේ වීනමුත් ප්‍රදීපාලොකය සක්වළගලින්
පිටත අඟලකුත් නොපවත්නේය එබඳුවූ ලොකාන්තරික නරකව
ළ මහත්වූ ආලොකය පහළවිය එහි උපන්සත්වයෝ අපභාසමව
මෙහි උපන්නාවූ අනිකුදු·සත්වයෝ ඇතැයි කියා ඒආලොකයෙ
න් ඔවුනොවුන් දැනගණිති–කුමණ පව්කළ මිනිස්සු එහි උපද
නාහුදයත් ?–මව්පියන්ටහා ධාර්මික ශ්‍රමණබ්‍රාහමණයන්ට අනාදර
කළවුන්හා අභයචොර නාගචොරාදීහුමෙන් ප්‍රාණඝාත අදත්තා
දානාදී සාහසික බලවත් පව්කළවුන්හා අළුගා මිථ්‍යාදෘෂ්ටි ගෙණ

පච්කල සත්වයෝ එහි උපදිති ඔවුන්ගේ ආත්මභාවය තුන්ගව්පම
ණ වෙයි වව්ලන්ගේ නියපොතුසේ දික් නියපොතු වෙයි වෘක්ෂ
යෙහි එල්ලී සිටිනා වව්ලන්සේ සක්වළ ගල එල්වී සිටිති යම්
කලෙක ඔවුනොවුන් සම්පවූවාහුද එකල අපවිසින් ගොදුරු ල
බනලදැයි විචෘතලනුන් පෙරලා අල්වා සුලඟින්ගෙණ මිහෙඩිසේ
ලොකය දරාසිටි ක්ෂාරෝදකයෙහි වැටී දියට දැමූ පිටිගුලිකාසේ
විලීනවෙයි විසිරයෙයි–තවද ඒඑසේමය, මේ දශසහශ්‍රී ලොකධා
තුවනම් කවරයත්?–දශසහශ්‍රී සක්වළ පළමුවෙනි සහශ්‍රී චූලනී
ලොකධාතු නම්වෙයි, චූලනී ලොක දහසෙක් විසහශ්‍රී මධ්‍යම ලො
කධාතු *නම්වෙයි, විසහශ්‍රී ලොක දහසෙක් ත්‍රිසහශ්‍රී මහාසහශ්‍රී න
ම්වෙයි, ත්‍රිසහශ්‍රී දහසෙක් චතුසහශ්‍රී නම්වෙයි, මෙම ක්‍රමයෙන්
වඩා දසවෙනි සහශ්‍රීයෙන් ගුණදූවූවේ දශසහශ්‍රී ලොකධාතු නම්
වෙයි, මෙසේ දසදහසක් සක්වළ එකපැහැර කම්පාවීය– මේකාර
ණයද ආශ්චර්යයී අද්භූත වන්නේය.)

ආනන්ද, ආනන්දය; යදා, යම්කලෙක්හි; බොධිසත්තො, බෝසත්
තෙම; මාතුකුච්ඡිං, මව්කුසට; ඔක්කන්තො හොති, එලඹෙන්නේ
වේද; (එකල්හි) චත්තාරො දෙවපුත්තා, වරම් රජදරුවෝ සතරදෙ
න; නං බො බොධිසත්තං වා, ඒබෝසතානන්ටද; බොධිසත්තමාතරං
වා, බෝසත් මෑණියන්ටද; කොචි මනුස්සොවා, පසමිතුරුවූ යම්කි
සි මනුෂ්‍යයෙක්හෝ; කොචි අමනුස්සොවා, චණ්ඩ එරුස යම්කි
සි යක්ෂයෙක්හෝ; මා විහෙඨෙසී'ති, දුශ්ශබ්දාදිවශයෙන් යම්කිසි
වෙහෙසක් නොකෙරෙත්වයිකියා; චතුද්දිසා, සතරදිග; රක්ඛාය,
ආරක්ෂාපිණිස; උපගච්ඡන්ති'ති, එලඹෙත්නාහුයයියනා; එතං, මේ
කාරණය;–පෙ–සලකම්.

ආනන්ද, ආනන්දය; යදා,–පෙ–එලඹෙන්නේවේද; (එකල්හි) බොධිස
ත්තමාතා, බෝසත්මවුතොමෝ; පකතියා සීලවතී හොති, ස්වභා
වයෙන්ම සිල්වත්වන්නීය; (එහෙයින්) පාණාතිපාතා විරතා, ප්‍රා
ණඝාතයෙන් විසෙසයෙන් වැලැක්කීය; අදින්නාදානා විරතා, වස්තු
ස්වාමිහුවිසින් කයින් වචසින් නුදුන් වස්තුවගැන්මෙන් විසෙසයෙන්
වැලැක්කීය; කාමෙසු මිච්ඡාචාරා විරතා, කාමමිථ්‍යාචාරයෙන් වි
සෙසයෙන් වැලැක්කීය; මුසාවාදා විරතා, මුසාවාදයෙන් විසෙසයෙන්
වැලැක්කීය; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා විරතා'ති, රහමෙරපා
ණයෙන් හෙවත් මද්‍යපාණයෙන් විසෙසයෙන් වැලැක්කීයයි
යනා; එතං, මේකාරණය;–පෙ–සලකම්–(මෙසේ බෝසත් මෑණියෝ
ස්වභාවෙන්ම සිල්වත් වන්නීය බෝසතානන් මවුකුස ඉපදීමට

ප්‍රථමයෙන් තාපසවරුන්ගේ පාමුල වැඳ සිල්ගත්තාහ මේ මහාමායා දේවිද අපමහබෝසතානෝ මවුකුස ඉපදීමට පළමුවෙන්, කාලදේවල සෘෂීන්ගේ පාමුල වැඳ සිල්ගත්තීය බෝසතානෝ කුස උපන්නැන්පටන් අනිකක්හු වැඳවේවයි සමානාසනව හිඳ වේවයි සිල්ගැණීම සුදුසුනොවන්නේයයි එබැවින් තොමෝම සිල්ගත්තිය ප්‍රාණඝාතාදී පවින් විසෙසයෙන් වැලැක්කීය– මේකාරණයද ආශ්චර්‍ය්‍ය අද්භූත වන්නේය.)

ආනන්ද,–පෙ–එලඹෙන්නේවේද; (එකල්හි) බොධිසත්තමාතු, බෝසත්මෑණියන්ට; පුරිසෙසු, පුරුෂයන්කෙරෙහි; කාමගුණූපසංහිතං, කාමබන්ධනයෙන්යුක්තවූ; මානසං, සිතෙක්; න උප්පජ්ජති, නූපදනේය; රත්තචිත්තෙන, රාගයෙන් රත්වූසිත්ඇති; කෙණචි පුරිසෙන, කිසියම් පුරුෂයෙක්විසින්; බොධිසත්තමාතා, බෝසත්මවුතොමෝ; අනතික්කමණීයා ච හොති ඉති, සමීපයට එලඹීමට නොහැකිවන්නීයයියන; එතං, මේකාරණය;–පෙ–සලකුම්–(මහබෝසතානෝ මවුකුස පිළිසුන්ගැන්පටන් බෝසත්මෑණියන්ට පුරුෂයන්කෙරෙහි කාමගුණසංහිතවූ රාගසිතෙක් නූපදනේය රාගයෙන් රත්වූ සිත්ඇති කිසියම් පුරුෂයෙකුවිසින් බෝසත්මෑණියන් සමීපයට එලඹීම නොහැක්වන්නේය ඉදින් යමෙක් එලඹෙන්නේවීනම් දිව්‍යසඞ්ඛලිකාවෙන් දෙපය වෙලී යානොහැකිවන්නේය මේකාරණයද ආශ්චර්‍ය්‍ය අද්භූත වන්නේය)

ආනන්ද, ආනන්දය;–පෙ–එලඹෙන්නේවේද; (එකල්හි) බොධිසත්තමාතා, බෝසත්මවුතොමෝ; පඤ්චන්නං කාමගුණානං, පඤ්චද්වාරාරම්මණවූ නොයෙක් වස්තුරාශීන්ගේ; ලාභිනී හොති, ලැබීම ඇතිවන්නීය; සා, ඒබෝසත්මවුතොමෝ; පඤ්චහි කාමගුණෙහි, පඤ්චකාමනිශ්‍රිතවූ වස්තුරාශියෙන්; සමප්පිතා, සන්තෘප්තාවූවාය; සමඞ්ගීභූතා, පඤ්චකාමසම්පත්තියෙන් සමඟිව; පරිචාරෙතී'ති, පිරිවර ඇතිවන්නීයයියන; එතං, මේකාරණය;–පෙ–සලකුම්– (යම්කලෙක මහබෝසතානෝ මවුකුස උපන්සේක්ද එතැන්පටන් බෝසත්මෑණියෝ පඤ්චකාමසම්පත්තීන්ගේ ප්‍රතිලාභයෙන්ද යසසින්ද සෙස්සන්ටවඩා අග්‍රවන්නීය මෙතැන්හි පඤ්චකාමසම්පත් යන්නෙන් දූත්වූයේ පඤ්චකාමනිශ්‍රිතවූ වස්තුමාත්‍රයෙක කෙලෙශකාමවිරතිය පළමුවෙන්ම දක්වනලද්දේය එකල මහබෝසතානෝ මවුකුස උපන්හයි අසා අවට රටවාසී සියලුරජදරුවෝ මහත් අගණ ආභරණහා පඤ්චතූර්‍ය්‍යාදිවශයෙන් පඤ්චද්වාරාරම්මණවස්තුවූ පඬුරුද එවූහ බෝසතානන්ගේ හා මෑණියන්ගේ කරණලදකර්මයාගේ උත්සන්නතාවයන්සා ලාභසත්කාරයන්ගේ ප්‍රමාණයක්ද නැත්තේය–මේකාරණයද ආශ්චර්‍ය්‍යඅද්භූතවන්නේය.)

ආනන්ද, ආනන්දය,-පෙ-එලඹෙන්නේවේද; (එකල්හී) බොධිසත්ත
මාතු, බෝසත්මෑනියන්ට; කොචිදෙවආබාධො, කිසියම්ආබාධයෙක්;
න උප්පජ්ජති, නොම උපදනේය; බොධිසත්තමාතා, බෝසත්මවු
තාමෝ; අකිලන්තකායා, (අවසෙසගර්භිනීන්සේ) නොකිලන්ශරීර
ඇත්ති, (එහෙයින්) සුඛිනීහොතී; සැපඇතිවන්නීය; බොධිසත්තමා
තා, බෝසත්මවුතොමෝ; තිරො කුච්ඡිගතං, (මෑණියන්ගේනාභියටඅ
භිමුඛව බඩපර්යඞ්කයෙන්)ඇතුළුකුක්ෂිගතව වැඩඋන්නාවූ; සබ්බ
ඞ්ගපච්චඞ්ගිං, (කලලාදී අවස්ථාඉක්මවා හස්තපාදාදී සණ්ඨාකාරයෙන්ස
ම්පූර්ණවූ )සියලු අඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඇත්තාවූ; අහීනින්ද්‍රියං, (චක්ෂුශ්‍රො
ත්‍රාදී) මනාවූඉඳුරන්ඇති; බොධිසත්තංච, බෝසතානන්ද; පස්සති,
(සැපවිහරණයපිණිස බෝසත්මෑණියෝ සුවසේ) දක්නීය; ආනන්ද, ආ
නන්දය; සුභො, යහපත්වූ; ජාතිමා, (මැණික්උපදනාභූමියෙහි උප
න්බැවින්) ජාතිමාණික්‍යයක්වූ; අට්ඨංසො, අටස්වූ; සුපරිකම්මකතො,
මොනවට පිරියම්කරණලද්දාවූ; වෙළුරියොමණි, වෛඩූර්‍ය්‍ය මාණික්‍ය
යක්තෙම; (යම්සේද)තත්‍ර, ඒමාණික්‍යයෙහි; ආවුතං, අමුණනලද්දාවූ;
සුත්තං, හුය; නීලංවා, නිල්වන්හෝ; පීතංවා, රන්වන්හෝ; ලොහි
තංවා රත්වන්හෝ; ඔදාතංවා, සුදුවන්හෝ; පණ්ඩුසුත්තංවා, පඬුවන්
හුයක්හෝ; අස්ස, වන්නේ; සෙය්‍යථා'පි, යම්සේද; නොහොත්; සෙ
ය්‍යථා'පි අස්ස, යම්සේවන්නේද; තමෙනං, ඒමාණික්‍යරත්නය; චක්ඛු
මා පුරිසො, අවිනෂ්ටවූ චක්ෂුප්‍රසාදඇති පුරුෂයෙක්තෙම;
හත්ථෙ කරිත්වා, අත්පත්කොට; හෙවත්, අත තබා ගෙණ; අයං ඛො
මණි, මේ මාණික්‍යයවනාහී; සුභො, යහපත් වන්නේය; වෙළුරියො,
වෛඩූර්‍ය්‍යමවන්නේය; ජාතිමා,. (මැණික් උපදිනාභූමියෙහි උපන්
බැවින්) ජාතිමාණික්‍යයක්වන්නේය; අට්ඨංසො, අටස්වන්නේය; සුප
රිකම්මකතො, (දක්ෂවූ මැණික්කර්මාන්ත කරන්නක්හුවිසින්)මනාව
පිරියම්කරණලද්දේය; තත්‍ර, ඒමාණික්‍යයෙහි; ආවුතං, අමුණනල
ද්දාවූ; ඉදං සුත්තං, මේහුය; නීලංවා, නිල්වන්යයි කියාහෝ;
පීතංවා, සවර්ණවර්ණයයි කියාහෝ; ලොහිතංවා, රක්තවර්ණ
යයි කියාහෝ; ඔදාතංවා, ශ්වෙතවර්ණයයි කියාහෝ; පණ්ඩුසුත්තං
වා, පඬුහුයයයිකියාහෝ; සෙය්‍යථා'පි පච්චවෙක්ඛෙය්‍ය, ප්‍රත්‍යවෙක්ෂා
කරන්නේ යම්සේද; එවමෙව ඛො, එපරිද්දෙන්ම; ආනන්ද, ආ
නන්දය;-පෙ-නාඛො උප්පජ්ජති, නොම උපදනේය; බොධිසත්තමා
තා, බෝසත් මවුතොමෝ; අකිලන්තකායා, (අවසෙස ගර්භිනීන්සේ
හස්තපාද උදධ්මාතකාදිවශයෙන්)නොකිලන්වූ ශරීරඇත්තිය; (එ
හෙයින්)සුඛිනී හොති, සුවපත්වන්නීය;-පෙ-සලකම්.-(සම්ක්ලේශ

අපමහබෝසතානෝ මවුකුසට එලඹුනුසේක්ද එතැන්පටන් බෝසත්
මෑණියන්ට කිසිපීඩා වෙක් නැත්තේය අවසෙස ගර්භිනීන්ගේ කු
ස සුදුමැලිව අත්පා ඉදිම දුර්වණීවෙති බෝසත්මවුවනාහි හස්තපාද උ
ෂ්මාතකාදී කයවිකලත්වයක් නැතිව සුවපත්වන්නීය බෝසතුන්ගේ
කුසල මහිමයෙන් වස්තුසුද්ධවන්නේය විදුරුගර්භයක්මෙන් මවුකුස
නිර්මලවන්නේය එබැවින් මවුකුසට එලඹ කලල අවස්ථා ඉක්මවා
හස්තපාදාදී අඞ්ගප්‍රත්‍යඞ්ගයන් සම්‍යකාරයෙන් සම්පූර්ණව චක්ෂු ශ්‍රො
ත්‍රාදී මනාවූ ඉඳුරන්ඇතිව ධර්මාශනාරූඪව හිඳිනා මහතෙරකෙ
ණෙකුන්සේ මෑණියන්ගේ නාභියට අභිමුඛව බද්ධපර්‍ය්‍යඞ්කයෙන්
වැඩහුන් බෝසතානන් සැපවිහරණයපිණිස බෝසත්මෑණියෝ සු
වසේ දක්නීය ඇතුළු කුසදී චක්ෂුර්විඥානය නූපදනාහෙයින් මහ
බෝසතානෝ මෑණියන් නොදක්නාසේක—බෝසත්මෑණියෝ කෙ
සේ දක්නීදැයත්?–යහපත්වූ විපුල පර්‍ය්‍යනාදී මැණික් ආකර
යෙක්හි උපන්නාවූ අටස්වූ දක්ෂවූ මණිකාරකයන්විසින් මනාකො
ට පිරියම්කරණලද්දාවූ යම් වෛඩූර්‍ය්‍යමාණික්‍යයක්වේද ඒමාණික්‍ය
රත්නයෙහි නිල්වන් වේවයි රත්වන් වේවයි ලේවන් වේවයි සු
දුවන් වේවයි පඬුවන් වේවයි යම්සේ අමුණනලද හුයෙක්වේද ඒ
මාණික්‍යරත්නය අවිනෂ්ටවූ චක්ෂුශප්‍රසාදඇති පුරුෂයෙක් අත ත
බාගෙණ බලනේ මේමැණිකවනාහී යහපත්වන්නේය වෛඩූර්‍ය්‍ය
වන්නේය මැණික්උපදනාභූමියෙහි උපන්හෙයින් ජාතිමත්වන්
නේය අටස්වන්නේය දක්ෂවූ මණිකාරකපුරුෂයන්විසින් මනා
කොට පිරියම්කරණලද්දේය ඒමාණික්‍යයෙහි අමුණනලද මේහුය
නීලවර්ණයයි කියාහෝ සුවර්ණවර්ණයයි කියාහෝ රක්තවර්ණයයි
කියාහෝ ශුභ්‍රවර්ණයයි කියාහෝ පඬුහුයකැයි කියාහෝ යම්සේ ප්‍රත්‍ය
වෙක්ෂාකරන්නේවේද එපරිද්දෙන් බෝසත්මෑණියෝ නෙත්‍රයට අවි
ෂයවූ ඇතුළ්කුස වසන බෝසතුන්ගේ මුඛසොභා බලබලා අද
ට මෙතෙක් වැඩිසේක අදට මෙතෙක් උසමහත්වූසේක ඇතුළ්
කුස වසන මපුතනුවන්ගේ රූසිරු මෙසේවනකල නිලුපුල් පෙ
තිවන් ඇස්සගලින් මා මා මුහුණ බල බලා ළඳ බොළඳ තෙපුල් කි
යකියා කෙළිණා කල මපුතනුවන්ගේ රූපශ්‍රී කෙසේනම් ප්‍රිය
නොවේද කවරකෙණෙකුන්ගේ සිත් නොපිණවාද කවර දවසෙක
මපුතනුවන්ගේ සුරතල්බස් අසම්ද කවරදවසෙක මපුතනුවන්
උරහිඳුවාගෙණ දරුසුරතල් විඳිම්දැයි සිතසිතා සතුටුව ප්‍රීතීන් පිණපි
ණා පිරුණු තෙල්පාත්‍රයක් දරණකෙණෙකුසේ ගැබ පිරිමැසූහ–මේ
කාරණයද අවසෙස දරුලත් සත්‍රීන්කෙරෙහි අවිද්‍යමානබැවින්
ආශ්චර්‍ය්‍ය අද්භූත වන්නේය.)

ආනන්ද, ආනන්දය, බොධිසත්තෙ, බෝසතාණන්වහන්සේ; සත්තාහජාතෙ, උපන්සත්දවස අතික්‍රාන්තවූකල්හී; මාතා, මවුතොමෝ; කාලංකරොති, කාලක්‍රියාකරන්නීය; තුසිතං කායං, තුසීදිව්‍යලොකයෙහි; උපපජ්ජතී'ති, (මරණින්මත්තෙහි මහානුභාවසම්පන්නදිව්‍යරාජයෙක්ව උපදනීයයි යන; එතං, මෙය;-පෙ-සලකම්.(මහබෝසතාණෝ උපන්සත්දවසින් මෑණියෝ කාලක්‍රියාකොට තුසීදිව්‍යලොකයෙහි මහේශාක්‍ය දිව්‍යරාජයෙක්ව උපන්හ මහබෝසතාණෝ උපන්හෙයින්ම මෑණියෝ කාලක්‍රියාකළාහු නොවෙති ආයුක්ෂයවීමෙන්ම කාලක්‍රියාකළහ මහබෝසතුන් විසූ ගර්භයනම් චෛත්‍යාගාරයක්මෙන් සෙස්සන් විසින් පරිභොගනොකටයුත්තේය, පියමහරජානන් වී සිතුදු බෝසත්මෑණියන් සිටියදී උන්හැර අනික්සත්‍රියෙක් අග්‍රමහෙසිකාස්ථානයෙහි තබන්නට නොහැකිවන්නේය; එබැවින් බෝසත්මෑණියන්ගේ ආයුෂය යම්පමණක්වේද එපමණකාලයක් සිට කාලක්‍රියාකෙරෙති, කවර වයසෙහි සිට කාලක්‍රියා කරන්නීදයත්? මධ්‍යමවයසෙහිය, ප්‍රථම වයසෙහි සත්වයන්ට ඡන්දරාගය බලවත්වෙයි එකල උපන් සත්වයන්ට රොගපීඩා ඇතිවන්නේය මධ්‍යමවයසින් දෙභාගයක් ඉක්මවා තුන්වනභාගයෙහි ඡන්දරාගය මඳව ශරීරය සුඛවන්නේය වස්තුව සුඛවූකල උපන් දරුවෝ නිරොගීවෙති එබැවින් බෝසත්මෑණියෝද ප්‍රථමවයසෙහි පඤ්චකාමසම්පත් අනුභවකොට මධ්‍යමකාලයෙහි කාලක්‍රියාකෙරෙති එබැවින් මහබෝසතුන් උපන් සත්දවසින් මෑණියෝ කාලක්‍රියාකොට තුසීදිව්‍යලොකයෙහි උපන්හ–මේ කාරණයද ආශ්චර්ය්‍ය අද්භූත වන්නේය.)

ආනන්ද, ආනන්දය; යථා ඛො පන, යම්ප්‍රකාරයකින් වනාහී; අඤ්ඤා ඉත්ථිකා, අන්‍යස්ත්‍රීහුවනාහී; නව මාසෙවා, නවමසක්හෝ; දස මාසෙවා, දසමසක්හෝ; කුච්ඡිනා ගබ්භං පරිහරිත්වා, කුසින් ගැබ පරිහරණයකොට; විජායන්ති, වදත්ද; බොධිසත්තමාතා, බෝසත්මවුතොමෝ; බොධිසත්තං, බෝසතාණන්; එවං නහි, එසේ (නවමසින්හෝ අටමසින්හෝ එකොළොස්මසින්හෝ) නොවදන්නීය; බොධිසත්තමාතා, බෝසත්මවුතොමෝ; දසෙව මාසානි, දසමාසයක් මුලුල්ලෙහි; කුච්ඡිනා, කුසින්; බොධිසත්තං, බෝසතාණන්; පරිහරිත්වා, පරිහරණයකොට; විජායතී'ති, වදන්නීයයි යන; එතං, මේකාරණය;-පෙ-සලකම්.

ආනන්ද, ආනන්දය; යදා, යම්කාලෙක්හිවනාහි; බොධිසත්තො, බොධිසත්වතෙම; *මාතුකුච්ඡිස්මා නික්ඛමති, මවුකුසින් නික්මෙණසේක්ද; (එකල්හි) පඨමං, පළමුකොට; දෙවා පතිගණ්හන්ති, දෙවියෝ පිළිගන්නාහුය; පච්ඡා, පසුව; මනුස්සා'ති, මනුෂ්‍යයෝ පිළිගන්නාහු;

ය යන; එතං–පෙ–සලකම්. * (යම්කලෙක්හි මහබෝසතාණෝ මවු
කුසින් බිහිවුනුසේක්ද එකල්හි ප්‍රථමයෙන් දෙවියෝ පිළිගන්නා
හුය–කෙසේ පිළිගත්තාහුදයත්.?–එදවස් බෝසත් මෑණියෝ
රන්කම් කරණලද සළුවක් හැඳ දුකුල පණ්ඩවස්ත්‍රයකින්
හිසපටන් දෙපයදක්වා පොරවා සිටියාය එකල්හි ඇසැහැල්ලූවූ
ගබ්හීසමුඩානය ධබරාවකින් දියත්තක් නික්මුණුසේවිය බෝ
සතාණෝ මවුකුසින් නිරායාසයෙන් නික්මුණුසේක එකල දෙ
ලොස්යොදුන් උසඇති සුඬාවාසවූ ක්ෂීණාශ්‍රව මහාබ්‍රහ්මයෝ ප්‍රකෘති
බ්‍රහ්මවෙසයෙන් අවුත් පළමුකොට රන්දැලින් පිළිගත්තාහුය නැවත
ඔවුන් මනුෂ්‍යයෝ දුහුල්සුඹුළුවෙන් පිළිගත්තාහුය– මේකාරණයද
ආශ්චර්යයී අද්භූතවන්නේය.)

ආනන්ද, ආනන්දය; යථාබොපන, යම්හෙයකින් වනාහී; අඤ්ඤා ඉ
ත්ථිකා, සෙසු ස්ත්‍රීහු; නිසින්නා වා, හිඳහෝ; නිපන්නා වා, සයනය
කොටහෝ; විජායන්ති, වදත්ද; බොධිසත්තමාතා, බෝසත් මවුතො
මෝ; බොධිසත්තං, බෝසතාණන්; නහෙවං විජායති, එසේ හිඳහෝ
ශයනහෝ නොවදන්නීය; බොධිසත්තමාතා බෝසත් මවුතොමෝ; ඨී
තාව බො, සිටම; බොධිසත්තං,බෝසතාණන්; විජායතීති, වදන්නීයයි
යන—පෙ—සලකම්—(අවසෙස ස්ත්‍රීන් කුසවසන දරුවෝ ජීණිණව
බස්නා අශුචිමත්තෙහි වැතිරගෙණ ආමාසයේ හිසතබා උදරපටල
යට පිටලා පිටකටුවට මුහුණලා වැසිකාලයෙහි ගස්සිදුරක් ආශ්‍රය
කොට කඳක්ව හිඳිනා වඳුරුපැටවකුසේ දෙදනහිස් ග්‍රීවයෙහි ඇන
දෙඅත්මිට් අකුළුවා දෙහනුයෙහි තබා උක්කුටුකයෙන් දස මසක්
හෝ එකොළොස් මසක්හෝ නවමසක්හෝ වසා වදන දවස් කම්ජ
වාතයෙන් දළඹුව සිඳී දෙපය පිටකටුව පැහැර තදව සිටිකල්හි හි
ස උදරපටලය වැදගෙණ හිස යටිව වැටීහුනු දරුවන් හිඳහෝ ශෙ
වහෝ හිසපෙරටම වදති බෝසත් මවුවනාහි දසමසක් මුලුල්ලෙහිම
ගර්භය පරිහරණයකොට සිටිපියෙහිම සිට දෙපය පෙරටම වදති
අපබුදුන් මවු මහාමායාදේවී දසමස් ඇවෑමෙන් දෙව්දහනුවර යනු
කැමතිව රජ්ජුරුවන්ට එපවත් කීහ රජ්ජුරුවෝ කපිලපුරයපටන්
දෙව්දහ නුවරදක්වා මාර්ගය අලඞ්කෘතකොට සරහා දේවින් රන්
සිවිගෙයක හිඳුවා නොයෙක් පූජාපෙළහරින් ගෙණයන්නාහ දෙව්ද
හනුවරට නුදුරුතැන ලුම්බිනීනම් සල්උයන් දැක උයන්කෙළිණ-

* මේවාරය සමහරපොතක–''යථාබොපනානන්ද' අඤ්ඤා ඉත්ථිකා
නිසින්නාවා නිපන්නාවා විජායන්ති''යනවාරයටමුලින්තිබේ–ඒනිසා
සන්නයෙහිත් එසේයෙදීමු: විමසාදතයුතු.

කැමතිව රජ්ජුරුවන්ට දන්වූහ රජ්ජුරුවෝ නන්දනෝද්‍යානයසේ උයන සරහා වට රැකවල් ලැවූහ දේවිය උයනට ප්‍රවිෂ්ටවූකෙණෙහි ම දේවීන්ගේ ශරීරය දුම්ලවිස් එකල්හි මගුල්සල්ගසමුල ශ්‍රීයහනක් පණවා වටතිර ඇද්දවූහ. දේවිය තිරය ඇතුළට ප්‍රවිෂ්ටව සල්අත්ත අතින්ගෙණ සිටියාහ එකෙණෙහි මහබෝසතාණෝ මවුකුසින් බිහිවූසේක–මේකාරණයද ආශ්චර්ය අද්භූතවන්නේය.)

ආනන්ද, ආනන්දය; යදා, යම්කලෙක්හි; බොධිසත්තො, බොධිසත්ව තෙම; මාතුකුච්ඡිස්මා නික්ඛමති, මවුකුසින් නික්මෙණසේක්ද; (එකල්හි) බොධිසත්තො, බොධිසත්වතෙම; පඨමං, ප්‍රථමයට; අප්පතොතාව * හොති, කුසලින් මහත්වුවත්කයින් අල්පමාණවනසේක එතකුදු වුවත්; චත්තාරො දෙවපුත්තා, වරම්රජදරුවෝසතරදෙන; නංපටිග්ගෙණ්හා, (ගුණයෙන් බැරැරුම්හෙයින්) ඔවුන් එක්වරෙක්හම පිළිගෙණ; දෙවි, එම්බා පින්වත්දේවීනි; මහෙසක්ඛො පුත්තො, (දෙව්බඹුන්සහිත සියලුලොකයාහට ශ්‍රෙෂ්ට මහාතෙජොබලපරාක්‍රම සමන්විතලක්ෂණ සම්පන්නවූ)පින්වත් පුත්‍රරුවනෙක්; තෙ උප්පන්නො, තීගේ කුස උපන්නේය;අත්තමනා හොහි,සතුටුවවයි කියා;මාතු පුරතො ඨපෙන්තී'ති, මෑණියන්ගේ අභිමුඛයෙහි තබන්නාහුයයියන; එතං, මෙය; —පෙ—සලකම්–(මහබෝසතාණෝ මවුකුසින් නික්මෙණ වේලෙහි කයින් කුඩාවුවත් කුසලින් බැරැරුම්වනහෙයින් වරම්රජදරුවෝ සතරදෙන එකපැහැර පිළිගෙණ මෑණියන් ඉදිරියේ තබා මහානුභාවසම්පන්නවූ පින්වත් පුත්‍රරුවනක් දේවීනි තීගේ කුස උපන්නේය බලා සතුටුවවයි කියා ප්‍රියතෙපුල් කියන්නාහ–මේකාරණයද ආශ්චර්ය අද්භූතවන්නේය.)

ආනන්ද, ආනන්දය;—පෙ—මාතුකුච්ඡිස්මා, මවුකුසින්; නික්ඛමාති, නික්මෙණසේක්ද; (එකල්හි) උදෙන අමක්ඛිතො, මවුකුස කුණුදියෙන් නොගැවසෙනලද්දේය; සෙම්හෙන අමක්ඛිතො, ශ්ලෙෂ්මායෙන් නොගැවසෙනලද්දේය; රුධිරෙණ අමක්ඛිතො, ලෙයෙන් නොගැවසෙනලද්දේය; කෙණචි අසුචිනා අමක්ඛිතො, මවුකුස රාගාදී කිසියම් අශුචියකින් නොගැවසෙනලද්දේය; (එහෙයින්) සුද්ධො, සුද්ධය; විසදො, ජාතිරඞ්ග මාණික්‍යයක්මෙන් පිරිසිදුවූ ශරීරඇතිසේක්; විසදෙව නික්ඛමති, (ධර්මාසනයෙන් බස්නා ධර්මකථිකයන්හු මෙන් දූත් දෙපා දිගුකොට කිසි අයාසයක්නැතිව) විසදව නික්මෙණසේක; ආනන්ද, ආනන්දය; සෙය්‍යථා'පි, යම්සේ; මණිරතනං, ජාතිරඞ්ගමාණික්‍යරත්නය; කාසිකෙ වත්ථෙ, කාශිත වස්ත්‍රයෙහි; නික්ඛිත්තං, නික්ෂෙපකරණලද්දේ; නෙවත්, සහවා තබනලද්දේ; කාසි

* "අප්පමතොතාව" සී සමහර පොතක.

කං වත්ථං, කසීවස්ත්‍රය; මණිරතනං නෙව මක්ඛෙති, මැණික්හි නොමඇලෙත්තේය; මණිරතනං, මාණික්‍යරත්නය; කාසිකං වත්ථං න'පි මක්ඛෙති, කසීවස්ත්‍රය නොම ඇලෙත්තේය; තං කිස්ස හෙතු, ඊට හෙතු කවරේද?; උභින්නං, කසීසළුවද මාණික්‍යයදයන දෙදෙනාගේ; සුද්ධත්තා, පිරිසිදු බැවිනි; ආනන්ද, ආනන්දස්ථවිරය; එවමෙව ඛො, එපරිද්දෙන්ම; යදා,—පෙ—සලකම්–(කසීසළුවත් මාණික්‍යරත්නයත් පිරිසිදුබැවින් ම්කසීසළුවකින් වසාතුබූ මාණික්‍යරත්නය කසීවස්ත්‍රය නොයැලේද කසීවස්ත්‍රය මාණික්‍යරත්නයෙහි නොඇලේද එමෙන් මහබෝසතානෝද මවුකුසින් ද පිරිසිදුබැවින් රාගමලාදී කිසිඅශුචියක් හා මිශ්‍රනොව කසීසළුවකින් වාසාතුබූ ජාතිරඞ්ග මාණික්‍යරත්නයක්මෙන් නිර්මලව නික්මුණුසේක–මේකාරණයද ආශ්චර්‍ය්‍යඅද්භූතවන්නේය.)

ආනන්ද,–පෙ–මාතුකුච්ඡිසමා නික්ඛමති, මවුකුසින් නික්මෙණසේක්ද; (එකල්හී) බොධිසත්තස්ස, බෝසතානන්ටහා; මාතුච්ච, මැණියන්ට; යෙන උදකකිච්චං කරොන්ති, ශීතොෂ්ණවශයෙන් යම්ජලයකින් උදකකෘත්‍යය කෙරෙත්ද;(එබඳුවූ) එකා සීතස්ස, සිහිල්ජලයාගේ එක්ධාරාවෙක; එකා උණ්හස්ස, උෂ්ණජලයාගේ එක්ධාරාවෙකැයි; වෙ උදකස්ස ධාරා, ජලස්කන්ධයෝ දෙදෙනෙක්; අන්තලික්ඛා, ආකාශයෙන්; පාතුභවන්ති,ප්‍රාදුර්භූතවන්නාහුයයි යන;—පෙ—සලකම්.–(බෝසත් මැණියන්ටහා මහබෝසතානන්ට උදකකෘත්‍යපිණිස සිහිල්ජලයෙන් එක්ධාරාවෙක උෂ්ණජලයෙන් එක්ධාරා වෙකැයි ජලධාරා දෙකක් ආකාශයෙන් පහලවිය–මේකාරණයද ආශ්චර්‍ය්‍ය අද්භූතවන්නේය.)

ආනන්ද, ආනන්දය; සම්පති ජාතො, එකෙණෙහි උපන්නාවූ; බොධිසත්තො, බොධිසත්වතෙම; සමෙහි පාදෙහි, (රන් මිරිවැඩි සඟලක් වැනිවූ දෙසිය සොළසක්පමණ මඟුල් ලකුණෙන් සැදුම් ලත්) සමවූ ශ්‍රීපාද යුගයෙන්; පතිට්ඨහිත්වා, පෘථුවියෙහි පිහිටා; සෙතම්හි ඡත්තෙ අනුධීරමානෙ, මහාබ්‍රහ්මයාවිසින් සිරසට ධවලච්ඡත්‍රය ධරණලදකල්හි; උත්තරාභිමුඛො, (දශදිශාවලොකනාවසානයෙහි) උත්තරදිශාභිමුඛව, සත්තපදවීතිහාරෙන,සත්පියවරක් අතික්‍රාන්තව; ගච්ඡති, යන්නේය; සබ්බාචදිසා, සියලුදිසාවන් විලොකෙති, බලයි;ලොකස්ස, (කාමරූපාරූපසඞ්ඛ්‍යාත භුවනත්‍රයවාසීවූ) සියලුලොකයාහට; අග්ගොහමස්මි, (මෛත්‍රී ක්ෂමොපසමාදි ගුණාඞ්ගයෙන්හා සමගෝ උත්කෘෂ්ටවූ අනික්කිසිකෙණෙක් නැතිහෙයින්) මම අග්‍රවන්නෙම්; ලොකස්ස, සියලු ලොකයාහට; ජෙට්ඨො හමස්මි, ජෙෂ්ඨයෙමි; ලොකස්ස, සියලු ලොකයාහට; සෙට්ඨො හමස්මි, ශ්‍රෙෂ්ඨයෙමි; අයමන්තිමා ජාති, මේ කෙළවර උත්පත්තිය වන්නේය;

නාඤ්ඤානි පුනබ්භවෝ'ති, දැන් මට නැවත භවෝත්පත්තියෙක් නැතැ
සිකියා; ආසභිං වාචං භාසති, උත්තමවචනයෙන් සිංහනාදකරණ
සේකැයි යනු; එතං, මේවචනය;—පෙ—සලකම්.

ආනන්ද, ආනන්දය; යදා, යම්කලෙක්හි; බොධිසත්තො, බොධිස
ත්වයන්වහන්සේ: මාතුකුච්ඡිස්මා නික්ඛමති, මවුකුසින් නික්මෙණ
සේක්ද; අථ, එකල්හි; (මේකාරණයක්) සදෙවකෙ, දෙවියන්සහිතවූ;
—පෙ—පාතුභවති, ප්‍රාතුර්භූතවන්නේයයියනු; යම්පි, යමෙක්ඇද්ද;
භන්තෙ, ස්වාමීන්වහන්ස; ඉදම්පි, මේකාරණයද; භගවතො, භා
ග්‍යවත් බුදුරජානන්වහන්සේගේ; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යමත්වූ; අබ්භුතං
ධම්මං, අද්භූත ධර්‍මයකැයි කියා; අහං, මම; ධාරෙමී'ති, ධරම්යි; හෙව
ත්, සලකම්යි කියා; (ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ බුදුන් අ
භිමුඛයෙහිම හිඳ බුදුරජානන්වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මයන්
පෙරබුදුන්ගෙන් ඇසූනියාවත් තමන්වහන්සේ දුටුනියාවත් ප්‍රකාශ
කොට දැක්වූසේක.)

(එදවස් මහබෝසතාණෝ මවුකුසින් බිහිවූකෙණෙහි උන්වහන්සේ
ගේම පුණ්‍යප්‍රභාවයෙන් ලොවඅද්භූතවූ ආශ්චර්‍ය්‍ය පුරාදෙතිසෙක්හළ
විය-**ඒ දෙතිස්මහ පූජාවනම් කවරයුත්?**-එදවස මිහිනැමති කාන්තා
වදීපඞ්කර පාදමූලයෙහිපටන් තමන් බුදුබව අචලගුණයෙන් සාරා
සඞ්ඛ්‍ය කල්පලක්ෂයක්මුලුල්ලෙහි පුරා ආහෙයින් මාසේම අචල ගු
ණඇතිසේකැයි සතුටුවව දසදහසක් සක්වළ දසදහසක් මහ
පොළොව නැමති හෙ රිනාද පවත්වා මහිගජ්ජනානම්වූ පළමුවන පූ
ජාව ලත්සේක.~තවද සවහස් පහන් දැල්වූ එකමමඟුල්ගෙයක්සේ
දසදහසක් සක්වළ මුලුල්ලෙහි පැවැත්තාවූ ආලොකය මාගේ බුදුන්
ලද දෙවන පූජාවය~තවද ජාතියෙන් අන්ධවූ මිනිසුන් උපන්තැ
න්පටන් නුදුටුවිරූආලොක දැක අනෙකප්‍රකාරවූ වණීදැක මේ
කෙසේවූ ආශ්චර්‍ය්‍යයෙක්දැයි “අහො සාධු අහො සාධු” සී කියකියා
ලොකාලොකකලාවූ සන්තොෂය මාගේ බුදුන්ලද්දාවූ තුන්වන පූජා
වය~තවද දසදහසක් සක්වළ මුලුල්ලෙහි උපන්නාවූ ජාතිගොළු
වන් කුරවීකනාද පවත්වා එකෙණෙහි ලීලොපෙතකොට ගී කීම
මාගේ බුදුන්ලද සතරවන පූජාවය~තවද උපන්තැන්පටන් ජා
තියෙන්ම බිහිරන් බෙරහඬ සක් හඬපමණක්හුත් නොඅසා එකණෙ
හි ගොළුවන් කියන ගීතිකාශබ්දයෙන් ඉකි බිඳ බිඳ ගායනා අසා
සාධුකාරදීම මාගේ බුදුන්ලද පස්වන පූජාවය~උපන්දාපටන් ප
සින් නොගියවිරූ පිළුන් දෙපය සොල්වා යොදුන්ගනන් දිවපියා න
ළුවන්සේ නටනටා අත්පොළසන්දිදී “අහො සාධු අහො සාධු” සී හඬ

ගාථා ශබ්දඝොෂාව මාගේ බුදුන්ලද සවන පූජාවය— තවද කුරු
ළුව උපන් සත්වයන් විශෙසවූ ගාත්‍රවලින් ඇවිද්දමින් සාධුකාරදිදී
නැටීම මාගේ බුදුන් ලද සත්වන ප්‍රතිසඞ්ඛ පූජාවිනාම— තවද ඒ ඒ
නන්නි බන්ධනාගාරයෙහි වසන හස්ති අශ්ව මයූර ශාරිකාදීන්හා
අඤ්ජරාදියෙහි ඇකිළි බඳ සත්වයන් තමතමන්ගේ බැඳුම් සිඳී
ස්වකීයවූ ස්ථානයට පැමිණ සන්තොෂයෙන් කරන්නාවූ පිළිරැව් දන
ස්ථානයන්වීම මාගේ බුදුන්ලද අටවන පූජාවය— තවද දශදහස
ක් සක්වල තෙලෙස්ලක්ෂ සැටදහසක් නරකවල්හි ගිනිනිවී සිහිල්වී
කපක් මුලුල්ලෙහි ගින්නෙන් දන තිරිසතුන්ගේ ගිනිගත් ශරීර දි
යකඳසේ සිහිල්ව ගියවේලෙහි ඔවුනොවුන් දැක කෙසේවූ විශ්මයෙ
ක්ද කොල නරකදුකින් අද අපි මිදීගියෙම්හයි කියා දසදහස
ක් සක්වළමුල්ලුලෙහි නරකවල සත්වයින් කිව්වාවූ සාධුකාර ශබ්ද
ඝොෂාව මාගේ බුදුන්ලද නවවන පූජාවය— තවද කපක්මුලු
ල්ලෙහි බත් පැන් නොලබන ප්‍රෙතයන්ගේ සා පිපාසා නිවී
බත්පැන්ලදින් "අහො සුඛං" කීවාවූ ශබ්දඝොෂාව මාගේ බුදු
න්ලද දසවන පූජාවය— තවද උන්තැන්පටන් මරණභයින්
ඇවිදිනාවූ තිරිසන් අපායෙහි වසන සත්වයන් ඔවුනොවුන් කෙ
රෙහි භයනැතිව සිත්සේ ඇවිදීම මාගේ බුදුන්ලද එකොළොස්වන
පූජාවය— තවද සියලුසත්වයන්ගේ උපන්දා උපන් අසාධ්‍යවූ රොග
සන්සිඳී "අහො සුඛං අහො සුඛං" යන සන්තොෂ වචන කීම මාගේ
බුදුන්ලද දොළොස්වන පූජාවය— තවද සියළුසත්වයන්ම ඔවුනො
වුන්ට අප්‍රිය වචනයන් නොකියා ප්‍රියවචනයන් කීම මාගේ බුදුන්
ලද තෙළෙස්වන පූජාවය— තවද අශ්වරාජයන් එකෙණෙහිම මධු
රනාදයෙන් හෙසාරවකිරීම මාගේ බුදුන්ලද තුදුස්වන පූජාවය—
තවද දශකුලෙනි ඇතුන්ම සන්තොෂයෙන් කුඤ්චනාද කිරීම මාගේ
බුන්ලද පසළොස්වන පූජාවය— තවද එදා මහිස ගවරාදී සියලු සි
වුපාසතුන් තමතමන්ගේ නාදඝොෂාකිරීම මාගේ බුදුන්ලද සො
ළොස්වන පූජාවය— තවද එදා සිංහරාජයන් නොයෙක් ගල්මුදුන
ට පැණනැගී "සත්වයෙනි බෝසත් මවුකුස පිළිසිඳිසේකැයි" ලොව
ට හඬගාන්නාක්සේ කරණලද මහත්වූ සිංහගර්ජනාව මාගේ බුදුන්
ලද සතළොස්වන පූජාවය— තවද එදා දසදහසක් සක්වළ දෙව්මි
නිසුන් පළඳනාලද කඞ්කණ කටකාදී ආභරණයන් සැලි ශ්‍රාණඇති
යන්සේ රවණයකිරීම මාගේ බුදුන්ලද අටළොස්වන පූජාවය— තව
ද එදා දශදිග්වූ දිගාන්තරයෙහි ප්‍රභාසඛ්ඛයෝ විහිද බුදුරැස්කඳසේ
දිවීම මාගේ බුදුන්ලද එකුන්විසිවන පූජාවය— තවද එදා වාතව
ලාහකාදී දිව්‍යපුත්‍රයන් සැඩපවන් දුරුකොට මඳසුවඳින් යෙදුනාවූ

මඳමඳපවන්පැවැත්වීම මාගේබුදුන්ලද විසිවන පූජාවය — තවද එදා වස්සවලාහක දිව්‍යපුත්‍රයන් අකාලමේඝගෙණ දසදහසක් සක්වළ එකෙණෙහි වැසිවස්වාපීම මාගේ බුදුන්ලද එක්විසිවන පූජාවය — තවද මහපොළොව පලාගෙණ නාඹ තල්කඳසා ජලධාරාවන් රිදීකඳසේ පැණනැගී ඒ ඒ දික්හි දිවීම මාගේ බුදුන්ලද දෙවිසිවන පූජානම — තවද එදා සියලු පක්ෂීන්ම එවේලෙහිම ආකාශයෙන් නොගොස් තුරුඅග නොහිඳ මිහිමඬලට බැස තමන්ගේ ධවනියෙන් මධුරනාද කිරීම මාගේ බුදුන්ලද තෙවිසිවන පූජානම — තවද එදා නේසුවහස් ගඟගාවන් යටබලා යන ගමන් හැර බුදුහු උපන්හයි සතුටුව බලාසිටින්නන්සේ නොගොසින් රඳපීම මාගේ බුදුන්ලද සූවිසිවන පූජාවය — තවද එදා දසදහසක් සක්වළ මුලුල්ලෙහි සතළිස්දහසක් මහාසමුද්‍ර ජලයන්ගේ මහරළසන්සිඳී ලුනුදිය අනාතඞීනව මධුරජලයෙන් පිරී ප්‍රසන්නව නිවී සැනහී තිබීම මාගේ බුදුන්ලද පස්විසිවන ප්‍රතිසන්ධි පූජාවය — තවද එදා සතළිස්දහසක් සාගරයෙහි පස්පියුම් පිපී විසිතුරු මලසුන්සේ වීම මාගේ බුදුන්ලද සවිසිවන ප්‍රතිසන්ධි පූජානම — තවද එදා දියගොඩ පිපෙන හැමමල්සමූහයන් එකණෙහි ප්‍රබුද්ධවීම මාගේ බුදුන්ලද සත්විසිවන ප්‍රතිසන්ධි පූජාවය — තවද එදා ගස් අතු ලිය ආදියෙහි ඒ ඒපියුම් පිපීම මාගේ බුදුන්ලද අටවිසිවන ප්‍රතිසන්ධි පූජාවය — තවද එදා දසදිග සුවදහසක් සක්වළ මුලුල්ලෙහි මහපොළවද පඞීතමුදුනේද බිම්පලා ගල්පලා සත්බුමු මහපියුම් පැනනැගී ඒ ඒතැන සිටීම මාගේ බුදුන්ලද විසිනවවන පූජාවය — තවද සියලු ආකාශය මුලුල්ලෙහි පියුමෙන් අතුරුනැතිව උඩුබලා නටුතිබී යටබලා කෙමිතිබී මල්වියන්සේ මැවීයාම මාගේ බුදුන්ලද තිස්වන පූජාවය — තවද දසදහසක් සක්වළ මුලුල්ලෙහි එකණෙහි මල්වැසි වැසපියා මුලුලොව එකම මල්අස්නක්සේ වීම මාගේ බුදුන්ලද එකතිස්වන . පූජාවය — තවද එදා නැගු ධවජමාලාවෙන් බඹලොව ගසා වසාගැන්ම මාගේ බුදුන්ලද දෙතිස්වන පූජාවය.

මෙසේ මහබෝසතානෝ ආශ්චය්‍ය්‍යී අද්භූතවූ දෙතිස්මහා පූර්වනිමිති පූජා පහළකරමින් බිහිවූ කෙණෙහි මහබඹ සුරනරනතින් ගොස් බිමට වැඩ පියුම්මත්තෙහි වැඩසිට දසදික්බලා දසදිගසිටි දිව්‍යමනුෂ්‍යයන්විසින් "ස්වාමීනි නුඹවඩන කෙණෙක් වේවයි මේදිග නැතැයි" කියා සුවඳ මල්ආදියෙන් පුදා "නුඹව මෙලොවට අග්‍රසේක නුඹව මෙලොවට උතුම්සේකැයි" දෙහොත්මුදු

න්දී සිටියාහු මහබෝසතාණෝ දසදික්බලා ඉක්බිති උතුරුදිගට සත්අඩියක් ගොස් "**අග්ගොහමස්මි ලොකස්ස**" යනාදීන් අභීත සිංහනාද පවත්වා වදාළසේක-මහබෝසතාණෝ බිමින් වැඩිසේක මහජනයාට අහසින් වඩනාසේ වැටහුනේය-මහබෝසතාණෝ දෘශ්‍යමානව වැඩිසේක මහජනයාට අදෘශ්‍යමානව වඩනාසේ වැටහුනේය-මහබෝසතාණෝ අචේලකව වැඩිසේක මහජනයාට විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසී වඩනාසේ වැටහුනේය-මහබෝසතාණෝ ළදරු අවස්ථාවෙන් වැඩිසේක මහජනයාට සොළොස්හැවිරිදි රජකුමරුවකුසේ වැටහුනේය.

මෙහි පහළවූ **දෙතිස්වැදෑරුම්වූ** ආශ්චර්‍ය්‍යධර්මයන්ට **පූර්වනිමිති** යයි කියන්ට කාරණා කවරේදයත්?—මෙහි සමවූ ශ්‍රීපාදමණ්ඩයන් පෘථිවියෙහි පිහිටීම චතුර්විධ ඍද්ධිපාදයන්ගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්ත වන්නේය-උත්තර දිශාභිමුඛව යාම මහජනයා මැඩ පවත්වා යාමට පූර්වනිමිත්ත වන්නේය-සත්පියවරක් ඔසවා යාම සප්තබොධ්‍යාංග ධර්මයන්ගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්ත වන්නේය-දිව්‍යමය සේසත්දැරීම විමුක්තිනැමති සේසත ලැබීමට පූර්වනිමිත්ත වන්නේය-පංචරාජකකුධභාණ්ඩයන් පංචවිධ විමුක්තීන්කෙරෙන් මුක්තවීමට පූර්වනිමිත්ත වන්නේය-දසදික්බැලීම අනාවරණඥානයාගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්තවන්නේය—අභීතසිංහනාද කිරීම කිසිවෙක්විසින් පැවැත්වියනොහැකි දම්සක්පැවැත්වීමට පූර්වනිමිත්ත වන්නේය—"අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො" යි යනාදීන් අභීතසිංහනාදකිරීම් නිරුපධිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන්පෑමට පූර්වනිමිත්ත වන්නේය—දශසහශ්‍රී ලොකධාතු කම්පාවීම සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්ත වන්නේය—දසදහසක් සක්වළ දෙවතාවෝ එකසක්වළෙක්හි රැස්වීම ධර්මචක්‍රය පවත්වනකල එකපැහැර ධර්මදෙශනාව පිළිගැන්මට පූර්වනිමිත්ත වන්නේය—ප්‍රථමයෙන් දෙවියන්ගේ පිළිගැන්ම සතර රූපාවචරධ්‍යානයන්ගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්ත වන්නේය-පසුව මිනිසුන්ගේ පිළිගැන්ම සතරඅරූපාවචරධ්‍යානයන්ගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්තවන්නේය-නැන්බඳනාලද වීණාවන්ගේ තෙමේම වාද්‍යකිරීම අනුපූර්වවිහාර ප්‍රතිලාභයට පූර්වනිමිත්ත වන්නේය-සම්බඳනාලද බෙරින්ගේ තෙමේම වාද්‍යකිරීම මහත්වූ ධර්මභෙරියගේ අනුශාසනාවට පූර්වනිමිත්ත වන්නේය-සිරගෙවල්වල වසන සත්වයන්ගේ බැමිසිඳීම අස්මිමාන සමුච්ඡේදයට පූර්වනිමිත්ත වන්නේය-ජාත්‍යන්ධයන්ගේ රූපදැක්ම දිවඇස් ලැබීමට පූර්වනිමිත්ත වන්

නේය-ජාතිබිහිරන්ගේ ශබ්දඇසීම දිවකන්ලැබීමට පූර්වනිමිත්තවන්
නේය-පිළුන්ගේ ජවසම්පත්තිය සතර සෘද්ධිපාදයන්ගේ වසඟයට
පූර්වනිමිත්ත වන්නේය-අඥනයන්ගේ සිහිලැබීම සතරසතිපට්ඨානධ
ර්මයන්ගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්ත වන්නේය-නොයෙක් දිගට
ගිය නැව් නියම පටුණුවලට පැමිණීම සිවුපිළිසිඹියාවගේ අධි
ගමයට පූර්වනිමිත්ත වන්නේය-රත්නයන්ගේ සිය තෙජොභාෂයෙ
න් තුමූම බැබලූ බව ලොකයාහට ධර්මනැමති ආලොකය දක්වීම
ට පූර්වනිමිත්ත වන්නේය-සතුරන්ගේ මෙත්සිත්ලැබීම සතරබ්‍රහ්ම
විහරණය ලැබීමට පූර්වනිමිත්ත වන්නේය-අවීචිමහානරකයෙහි ගිණි
නිවීම එකොළොස්වැදෑරුම්වූ ගිණිනිවීමට පූර්වනිමිත්ත වන්නේය-
ලොකන්තරික නරකවල ආලොකපහළවීම අවිද්‍යානැමති අන්ධකා
ර විධ්වංශනයකොට ප්‍රඥනැමති ආලොක දක්වීමට පූර්වනිමිත්ත ව
න්නේය-මහාසමුද්‍රයාගේ මිහිරිබව නිර්වාණරසයෙන් එකරසවීමට
පූර්වනිමිත්ත වන්නේය-වාතයාගේ ගමන්වැළකීම දෙසැටදෘෂ්ටිගති
බිඳීමට පූර්වනිමිත්ත වන්නේය- නොයෙක් පක්ෂීන්ගේ බිමයාම අව
වාද අසා මහජනයා දිවිහිමියෙන් සරණයාමට පූර්වනිමිත්ත වන්නේ
ය-චන්ද්‍රයාගේ ඉතා බැබලීම බොහෝදෙනාගේ මෙත්සිත් ඉපදීම
ට පූර්වනිමිත්ත වන්නේය-සූර්ය්‍යයාගේ සීතොෂ්ණ විරහිත සෘතුසුඛ
ත්වය කායිකචෛතසික සැප ඉපදීමට පූර්වනිමිත්ත වන්නේය-දෙ
වියන්ගේ විමන්දෙර අත්පොළසන්දිදී කෙළීම බුදුබවට පැමිණ
උදන්ඇනීමට පූර්වනිමිත්ත වන්නේය- චාතුද්වීපික මහාමෙඝයාගේ
වර්ෂාව සද්ධර්මවර්ෂා වැස්වීමට පූර්වනිමිත්ත වන්නේය-සත්වයන්ගේ සා
පිපාසා සන්සිඳීම කායගතාසති භාවනානැමති අමෘතප්‍රතිලාභයට
පූර්වනිමිත්ත වන්නේය-දශසහශ්‍රී ලොකධාතුව එකධජමාලාවෙන්
සැදුම්ලත්බව ආර්ය්‍යධජ නැඟීමට පූර්වනිමිත්ත වන්නේය-මෙසේ ම
හ තෙරහු දෙතිස්මහා පූර්වනිමිති පහළවීමට ආශ්චර්ය්‍ය අද්භූත වන්
නේයයි වදාළසේක-එකල්හි බුදුරජානන්වහන්සේ අමායෙහි දිව
ඕජස් බහන්නාසේ ලොකොත්තරවශයෙන් ආශ්චර්ය්‍ය අද්භූත ධර්ම
යන් ප්‍රකාශකිරීමට නයදී වදාළසේක.)

ආනන්ද, ආනන්දය; නඛොමානිහ, (තෝ යමක්හෙතුකොටගෙණ තථාගතොත්තමයාගේ ආශ්චර්‍ය්‍ය අද්භූතධර්‍මයන් ප්‍රකාශකොට කී යෙහිවේද) එහෙයින්; ඉදම්පි, මේ කාරණයද; තථාගතස්ස, තථාගතොත්තමයාගේ; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යමත්වූ; අබ්භූතං ධම්මං, අද්භූත ධර්‍මයකැයි කියා; ත්වං, තෝ; ධාරෙහි, ධරව;–ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; තථාගතස්ස, (තථාගතාදි කාරණයෙන් යුක්තවූ) සර්‍වඥයාහට; විදිතා, (ශ්‍රාවකයෝ වනාහි ආවර්ජනා රහිතවූ නහාන මුඛධොවනාදි කාලයෙහි විවේකයකට නොපැමිණි යාහු ඉක්මුණාවූ සංස්කාරධර්‍මයන් නිරවශෙසයෙන් සම්මර්ශනයකොට ත්‍රිලක්‍ෂණයකරන්ට නොහැකිවෙති විවෙකයකට පැමිණිකල අවකාශමාත්‍රයක්ම ලැබ සම්මර්ශනයකෙරෙති-සර්‍වඥවරයෝනම් එසේ නොව සැමවේලෙහිම සත්දවසක් ඇතුළත පවත්නාලද සංස්කාරධර්‍මයන් ආදියෙහිපටන් නිරවශෙසයෙන් සම්මර්ශනයකොට ත්‍රිලක්‍ෂණයටනගා විසර්ජනය කෙරෙති ඔවුන්විසින් නොදන්නාලද ධර්‍මයෙක්නම් නැත්තේය එබැවින් (විශෙසයෙන්ම දන්නාලද්දවූ; වෙදනා, (නෛෂ්ක්‍රම්‍ය නිශ්‍රිතවූ) වෙදනාවෝතුමූ; උප්පජ්ජන්ති, උපදනාහුය; විදිතා, තමන් විසින් දන්නාලද; (වෙදනාවෝ) උපට්ඨහන්ති, වැටහෙන්නාහුය; විදිතා, (තථාගතෝත්තමයා විසින්) දන්නාලද වේදනාවෝ; අබ්භත්ථං ගච්ඡන්ති, කෙළවරට යන්නාහුය; විදිතා සඤ්ඤා, *තමන් විසින් දන්නාලද සංඥවෝ; විතක්කා, (තමන් විසින් දන්නාලද) විතර්‍කයෝ; උප්පජ්ජන්ති, උපදනාහුය; විදිතා, තමන් විසින් දන්නාලද විතර්‍කයෝ; උපට්ඨහන්ති, වැටහෙන්නාහුය; විදිතා, තමන්විසින් දන්නාලද විතර්‍කයෝ; අබ්භත්ථං ගච්ඡන්ති, කෙළවරට යන්නාහුය; ඉදම්පි–පෙ–ත්වං, තෝ; ධාරෙහී'ති, ධරාගණුව හි වදාළසේක–(යම්සේ ශීඝ්‍රස්නානයකොට සිටි පුරුෂයෙක් සමන්මල්කඩක් ලදින් උත්තමාඞ්ගවූ සිරස්හි පිහිටුවාද එමෙන් බුදුන්ගේ දෙශනානැමති සමන්මල්කඩ ලදින් මස්තකයෙන් පිළිගෙණ තමන් ආදරයෙන් පිළිගත්බව මේ මතුකියන පාඨයෙන් බුදුරජානන් වහන්සේට දැන්වූසේක.)

---


* "විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති විදිතා විතක්කා උප්පජ්ජන්ති" සී-සමහරපොත්හි.

භන්තෙ; ස්වාමීන්වහන්ස; භගවතො, භාග්‍යවත් බුද්ධරජානන්වහන්සේට; විදිතා–පෙ–අබ්භඤ්ඤං ගච්ඡන්ති, අදර්ශනයට යන්නාහුයයි යන; යම්පි, යමෙක්ඇද්ද; භන්තෙ, ස්වාමීන්වහන්ස; ඉදම්පි, මේ කාරණයද; අහං, මම; භගවතො, භාග්‍යවත් බුද්ධරජානන්වහන්සේගේ; අච්ඡරියං, ආශ්චර්ය්‍යමත්වූ; අබ්භුතං ධම්මං, අද්භූත ධර්මයකැයි කියා; ධාරෙමි ඉති, ධරාගනිමියි ප්‍රකාශකළසේක; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ, ඉදං, මේ **ආශ්චර්ය්‍ය අද්භූත** සූත්‍රාන්ත ධර්මදෙශනාව; අවොච, (බුදුන් ප්‍රධානකොටඇති මහසඞ්ඝයා මධ්‍යයෙහි) ප්‍රකාශකොට වදාළසේක; (එකල්හි) සත්ථා, ශාස්තෲවූ බුදුරජානන්වහන්සේ; සමනුඤ්ඤො අහොසි, විසඳ වදාළසේක; හෙවත් (මේධර්මදෙශනාව දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ සියලුලොකයාහට වැඩපිණිස වන්නේයයි කියා) අනුදැන වදාළසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; අත්තමනා, ප්‍රසන්නවූ සිත්ඇත්තාහු; ආයස්මතො ආනන්දස්ස, ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේගේ; භාසිතං, දෙශනාවට; අභිනන්දුන්ති, විශෙෂයෙන්ම සතුටුවූවාහුය.

**අච්ඡරියබ්භුත සුත්තන්තය**

**නිමි.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු